# බෞද්ධ වන්දනා ගාථා සහ පිරිත්

(සිංහල තේරුම් සහිතව)

**සබ්බ දානං ධම්ම දානං ජිනාති**



<u>පටුන</u>


| පිටුව | |
|---|---|
| 1 | නමස්කාරය, තෙරුවන් සරණ යාම, පන්සිල්, සමාදන් වීම, වන්දනා ගාථා |
| 2 | බුද්ධ පූජා ගාථා |
| 3 | රත්නමාලී යන්ත්‍ර ගාථා, දළද වහන්සේ වන්දනා කිරිම |
| 4 | සොලොස්මස්ථාන වැඳීම |
| 5 | ඡත්ත මාණවක ගාථා |
| 6 | ජය මංගල ගාථා |
| 7 | මහා මංගල සූත්‍රය |
| 8-9 | රතන සූත්‍රය |
| 10 | කරණීය මෙත්ත සූත්‍රය |
| 11 | මහා ජයමංගල ගාථා |
| 12 | සෙත් ගාථා |
| 13-14 | ජය පිරිත |
| 15 | අටවිසි පිරිත |
| 16 | චූල ජිනපඤ්ජරය( දස දිසා පිරිත) |
| 17 | ජල නන්දන පිරිත |
| 18-19 | සීවලී පිරිත |
| 20 | බොජ්ඣංග පිරිත |
| 21 | ගිනි පිරිත, වැසි පිරිත |
| 22 | වට්ටක පිරිත |
| 23 | අංගුලිමාල පිරිත |
| 24-25 | ජිනපඤ්ජරය |
| 26 | ඇතවුම් පිරිත |
| 27 | මෙත් වැඩීම |
| 28 | නරසීහ ගාථා |
| 29 | නව ග්‍රහ ශාන්තිය |
| 30 | බෝධි පූජා කවි |
| 31 | දෙවියන්ට පින් දීම |

**<u>නමස්කාරය</u>**
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

**<u>තෙරුවන් සරණ යාම</u>**
බුද්ධං සරණං ගච්ඡාමි
ධම්මං සරණං ගච්ඡාමි
සංඝං සරණං ගච්ඡාමි

දුතියම්පි බුද්ධං සරණං ගච්ඡාමි
දුතියම්පි ධම්මං සරණං ගච්ඡාමි
දුතියම්පි සංඝං සරණං ගච්ඡාමි

තතියම්පි බුද්ධං සරණං ගච්ඡාමි
තතියම්පි ධම්මං සරණං ගච්ඡාමි
තතියම්පි සංඝං සරණං ගච්ඡාමි

**<u>පන්සිල් සමාදන් වීම</u>**
පාණාතිපාතා වේරමණී සික්ඛාපදං සමාදියාමි
අදින්නාදානා වේරමණී සික්ඛාපදං සමාදියාමි
කාමේසු මිච්ඡාචාරා වේරමණී සික්ඛාපදං සමාදියාමි
මුසාවාදා වේරමණී සික්ඛාපදං සමාදියාමි
සුරාමේරය මජ්ජපමාදට්ඨානා වේරමණී සික්ඛාපදං සමාදියාමි

**<u>බුදුගුණ සිහි කිරීම</u>**
ඉති’පි සෝ භගවා අරහං සම්මාසම්බුද්ධෝ
විජ්ජාචරණසම්පන්නෝ සුගතෝ ලෝකවිදූ
අනුත්තරෝ පුරිසදම්මසාරථී
සත්ථා දේව මනුස්සානං බුද්ධෝ භගවා’ති.

**<u>දහම්ගුණ සිහි කිරීම</u>**
ස්වාක්ඛාතෝ භගවතා ධම්මෝ සන්දිට්ඨිකෝ
අකාලිකෝ ඒහිපස්සිකෝ ඕපනයිකෝ
පච්චත්තං වේදිතබ්බෝ විඤ්ඤූහී’ති.

**<u>සඟගුණ සිහි කිරීම</u>**
සුපටිපන්නෝ භගවතෝ සාවකසංඝෝ
උජුපටිපන්නෝ භගවතෝ සාවකසංඝෝ
ඤායපටිපන්නෝ භගවතෝ සාවකසංඝෝ
සාමීචිපටිපන්නෝ භගවතෝ සාවකසංඝෝ
යදිදං චත්තාරි පුරිසයුගානි අට්ඨපුරිස පුග්ගලා
ඒස භගවතෝ සාවකසංඝෝ
ආහුනෙය්‍යෝ පාහුනෙය්‍යෝ
දක්ඛිණෙය්‍යෝ අඤ්ජලිකරණීයෝ
අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලෝකස්සා’ති.

**<u>චෛත්‍ය වන්දනාව</u>**
වන්දාමි චේතියං සබ්බං
සබ්බඨානේසු පතිට්ඨිතං
සාරීරිකධාතු මහා බෝධිං
බුද්ධරූපං සකලං සදා.

**<u>බෝධි වන්දනාව</u>**
යස්ස මූලේ නිසින්නෝ’ව
සබ්බාරි විජයං අකා
පත්තෝ සබ්බඤ්ඤුතං සත්ථා
වන්දේතං බෝධි පාදපං.

ඉමේ ඒතේ මහාබෝධි
ලෝකනාථේන පූජිතා
අහම්පි තේ නමස්සාමි
බෝධිරාජා නමත්ථු තේ.

ඉන්දනීල වණ්ණපත්ත සේත ඛන්ධ භාසුරං
සත්ථු නෙත්ත පංකජාභිපූජිතග්ග සාතදං
අග්ගබෝධි නාම වාම දේව රුක්ඛ සන්නිභං
තං විසාල බෝධි පාදපං නමාමි සබ්බදා.

# බුද්ධ පූජා ගාථා

**පූජා අරාධනාව**

තිවේදයාමි සම්බුද්ධං
වීතරාගං මහාමුනිං
නිමන්තයාමි සුගතං
ලෝකජෙට්ඨං නරාසභං

**පහන් පූජාව**

ඝනසාරප්ප දිත්තේන
දීපේන තම ධංසිනා
තිලෝක දීපං සම්බුද්ධං
පූජයාමි තමෝනුදං

**සුවඳ දුම් පූජාව**

ගන්ධ සම්භාර යුත්තේන-ධූපේනාහං සුගන්ධිනා
පූජයේ පූජනීයං තං - පූජා භාජනමුත්තමං

සුගන්ධිකාය වදන - මනන්ත ගුණ ගන්ධිනං
සුගන්ධිනා'හං ගන්ධේන- පූජයාමි තථාගතං

**මල් පූජාව**

වණ්ණ ගන්ධ ගුණෝපේතං
ඒතං කුසුම සන්තතිං
පූජයාමි මුනින්දස්ස
සිරිපාද සරෝරුහේ

පූජේමි බුද්ධං කුසුමේනනේන
පුඤ්ඤේන මේතේන ලභාමි මොක්ඛං
පුප්ඵං මිලායාති යථා ඉදංමේ
කායෝ තථා යාති විනාසභාවං

**පැන් පූජාව**

අධිවාසේතු නෝ භන්තේ - පානීයං පරිකප්පිතං
අනුකම්පං උපාදාය - පතිගණ්හාතුමුත්තමං

**ආහාර පූජාව**

අධිවාසේතු නෝ භන්තේ- භෝජනං පරිකප්පිතං
අනුකම්පං උපාදාය - පතිගණ්හාතුමුත්තමං

**ගිලන්පස පූජාව**

අධිවාසේතු නෝ භන්තේ - ගිලාන පච්චයං ඉමං
අනුකම්පං උපාදාය - පතිගණ්හාතුමුත්තමං

**දැහැත් පූජාව**

නාගවල්ලි දලූපේතං - චුණ්ණ පූග සමායුතං
තාම්බූලං පතිගණ්හාතු -සකප්පර මිදං ජිනෝ

**සියල්ල එකවිට පූජා කිරීම**

අධිවාසේතු නෝ භන්තේ-සබ්බං සද්ධාය පූජිතං
අනුකම්පං උපාදාය - පතිගණ්හාතුමුත්තමං



**පූජා අරාධනාව**

වීතරාග මහා මුණි වූ, ලෝකාග්‍ර වූ, නර ශ්‍රේෂ්ඨ වූ සුගතවූ සම්බුදුරජාණන් වහන්සේට ආරාධනා කරමි

**පහන් පූජාව**

කපුරුවලින් දැල් වූ අඳුර නස්නා පහතින් තුන් ලොවට එකම පහනක් වූ අවිදු අඳුර දුර ලන බුදුරදුන් පුදමි

**සුවඳ දුම් පූජාව**

පූජාවන්ට සුදුසු වූ පූජා ලැබුවා වූ උතුම් බුදුරදුන් හට මේ සුවඳ දුමින් පුදමි.

අපමණ ගුණ සුවඳින් සුවඳවත් වදන් ඇති, තථාගතයන් වහන්සේට සුවඳින් පුදමි.

**මල් පූජාව**

පැහැයෙන් හා සුවඳින් යුත් මේ මල් රුස මුනිඳුන් සිරිපා පියුමට පුදනෙමි.

මේ කුසුමින් බුදුන් පුදමි
මේ පිනින් මොක් සුවය ලබමි!
මේ මල් මැලවී යන්නා සේ
මාගේ සිරුරද විනාශයට පත් වෙයි.

**පැන් පූජාව**

භාග්‍යවතුන් වහන්ස, පිළිගැනුමට යෝග්‍ය වූ මේ පැන් අනුකම්පා පෙරදැරිව ඉවසා වදාරන සේක්වා!

**ආහාර පූජාව**

භාග්‍යවතුන් වහන්ස, පිළිගැනුමට යෝග්‍ය වූ මේ බොජුන් අනුකම්පා පෙරදැරිව ඉවසා වදාරන සේක්වා!

**ගිලන්පස පූජාව**

භාග්‍යවතුන් වහන්ස, පිළිගැනුමට යෝග්‍ය වූ මේ ගිලන්පස අනුකම්පා පෙරදැරිව ඉවසා වදාරන සේක්වා!

**දැහැත් පූජාව**

බුලතින් හා හුණු පුවක් කපුරින් යුත්, මේ දැහැත්, තථාගතයන් වහන්ස ඉවසා වදාරන සේක්වා!

**සියල්ල එකවිට පූජා කිරීම**

භාග්‍යවතුන් වහන්ස, පිළිගැනුමට යෝග්‍ය වූ සැදැහෙන් පුදන ලද මේ සියල්ල අනුකම්පා පෙරදැරිව ඉවසා වදාරන සේක්වා!

## රත්නමාලී යන්ත්‍ර ගාථා

1 සං සාර සාරෝඝ විනීත ණී සං
සං ණීත සාතං සුවිසාර ධී සං
සං ධීරකං සොණ්ණ තනු පලා සං
සං ලාප දේසිං පණමේහි සා සං

2 සං සාහිගං කේවල මෝහ නා සං
සං නාහකං මාර රණෙ විසේ සං
සං සේවිතං දාසි මුදාර හා සං
සං හාර ධම්මං පණමේ සදා සං

3 සං දාසගං නාසිත පාප නා සං
සං නාප ධංසිං හත ඝෝර පා සං
සං පාර ගාමිං සුවිසාර වා සං
සං වාර සංඝං පණමේ රසා සං

## සිංහල තේරුම්

1 සසර සැඩ පහර නවතා නිවන් වැද
පැතිර නැණති දිරිමත් රත් පතක් ලෙද
නිතර දිලෙන තුම් සදහම් දෙසන ළද
වැතිර වදිම් මගෙ සම්බුදු මහිම් සද

2 සැක තැත් දුරු කරන එලෙසින් මෝ නසන
යුදැදුම් ලෙසින් මර යුදයෙහි දිවි රකින
ඇසුරින් සතුට දෙන කෙලෙසුන් ඇති නසන
නමදිම් බැතින් සිරි සදහම් මිණි පහන

3 සඟ සැප දෙන නැසිය යුතු පව් හැම නසන
බව බැම් සුණු විසුණු කර නිති ගුණ පුරණ
ළත් සැප දමා පර තෙර වෙත නෙත යොමන
වදිනෙම් නිති පතා පින්සරු මහ සඟන

## දළද වහන්සේ වන්දනා කිරීම

ලෝකේක නාථ වදනම්බුජ රාජහංසං

විනෙය්‍ය කෝ මුදවනං කිර ජෝතයන්තං

අද්ධුන්ද්‍රකාර වරරූප විරාජමානං

වන්දමි සාදු මමලං ජින දන්ත ධාතුං

## සොලොස්මස්ථාන එක විට වැඳීම

මහායංගණං නාගදීපං කල්‍යාණං පදලාඤ්ජනං
දිවාගුහං දීඝවාපි චේතියඤ්ච මුතිංගණං
තිස්සමහා විහාරඤ්ච බෝධිං මරිචවට්ටියං
සොණ්ණමාලී මහාචේතිං ථූපාරාම හයාගිරිං
ජේතවනං සේලචේතිං තථා කාචරගාමකං
ඒතේ සෝළසඨානානි අහං වන්දමි මුද්ධනා.

## සොලොස්මස්ථාන වෙන් වෙන් ව වැඳීම.

1. මහායංගණ චෛත්‍යය
ලංකාය යත්ථ පඨමං සුගතෝ නිසජ්ජ
යක්ඛේ දමේසි නිජ සාසන පාලානාය
ඨානේ තහිං නිහිත කුන්තල ගීවධාතුං
වන්දමි සාධු මහියංගණ ථූප රාජං.

2. නාගදීප චෛත්‍යය
හගිනි සුත මාතුලේහි දින්නේ
මණි පල්ලංක වරේ යහිං නිසින්නෝ
මුනි ධම්ම මදේසයී ඵණීනං
සිරසා තං පණමාමි නාගදීපං.

3. කල්‍යාණි චෛත්‍යය
ආයාචනාය මණි අක්ඛි මහෝරගස්ස
යස්මිං නිසීදි හගවා මණිමණ්ඩපස්මිං
තස්සූපරිට්ඨීත මුපට්ඨීත වීතරාගං
කල්‍යාණ චේතියමහං සිරසා නමාමි.

4. ශ්‍රී පාදස්ථානය
කල්‍යාණිතෝ ගගනතෝ මුනි යත්ථ ගන්ත්වා
දස්සේසි චක්ක වර ලක්ඛණ පාදලඤ්ජං
ලංකා මහී වර වධූ මකුටෝපමානං
වන්දමහං සුමනකූට සිලුච්චයං තං

යන්නම්මදය නදියා පුලිනේ ච තීරේ
යං සච්ච බද්ධ ගිරිකෙ සුමනා චලග්ගේ
යං තත්ථ යෝනකපුරේ මුනිනෝ ච පාදං
තං පාද ලාඤ්ජන මහං සිරසා නමාමි.

5. දිවාගුහාව
ඛීණාසවේහි සහ පඤ්චසතේහි ගන්ත්වා
යස්මිං අකාසි හගවා සදිවාවිහාරං
සංඵුල්ල සාල සුමනාවල පාද දේසේ
වන්දේ සුසීතලමහං හගවා ගුහං තං.

6. දීඝවාපි චෛත්‍යය
යත්ථ නිසීදිය හගවා
සසවකෝ සාධු සමප්පයී
සමායිතං දීඝවාපි ථූපං
රෝහණපුර මණ්ඩනං වන්දේ.

7. මුතියංගණ චෛත්‍යය
විමල සීතල හූරි ජලාමයප් ජ්
පහව කඤ්ජ රජෝහරි පිඤ්ජරං
ගිර නදී වන දේව සුපූජිතං
නමථ තුංග මුතිංගණ චේතියං.

8. තිස්සමහාරාම චෛත්‍යය
නික්ඛිත්ත සම්පුණ්ණ සසංක බිම්බ
සංකාස භාසන්ත ලලාට ධාතුං
ආකාරයී තිස්ස නරිස්සරෝයං
ථූපං නමේ තිස්ස මහා විහාරේ

9. අනුරාධපුර ශ්‍රී මහාබෝධීන්වහන්සේ
සුපතිට්ඨීත රට්ඨනුරාධපුරේ
සමධිට්ඨීත දක්ඛිණ සාඛ හවං
සුහ මේඝවනම්බර මේඝ නිහං
ජය බෝධි මහං පනමාමි වරං.

10. මිරිසවැටි චෛත්‍යය
අහයරාජ සධාතුක කේතු වරං
සුනිධාය කතං බහුමානිතං
සකලහිතං පණමේ සද
මරිචවට්ටික චේතිය මුත්තමං.

11. රුවන්මැලි මහසෑය
සයිංසු යස්මිං සුගතස්ස ධාතු
නිම්මාය රංසුජ්ජුල බුද්ධ රූපං
සුවණ්ණමාලී’ති පතීත නාමං
වන්දම’හං ථූපවරං මහග්ඝං.

12. ථූපාරාම චෛත්‍යය
යස්මිං දක්ඛිණ මක්ඛකඤ් ච මුනිනෝ
පත්තප්පමාණා තනු
ධාතුවාපි නිධාය ලෝක මහිතා
ජබ්බණ්ණ සොහාකුලා
දේවානම්පියතිස්ස හූපතිවරෝ
කාරේසි සද්ධාධනෝ
ථූපාරාම වරං නමාමි තම’හං
අජ්ඣායිතං සත්ථුනා.

13. අහයගිරි චෛත්‍යය
කත නව මණිකම්මේ ධාතුගබ්හේ සුරම්මේ
කනක වසහ කුච්ජිං ධාතුනා පූරයිත්වා
විහිත මහය රඤ්ඤා ධඤ්ඤ පුඤ්ඤාධිවාසෝ
අහයගිරි විහාරේ චාරු ථූපං නමාමි

14. ජේතවනාරාම චෛත්‍යය
පතිට්ඨපෙත්වා ජිනකාය බන්ධනං
සකේසධාතුං සහ දේහ ධාතුයෝ
මහාමහාසේන නරින්ද කාරිතං
සුචේතියං ජේතවනං නමාම’හං

15. සේල චෛත්‍යය
මහාදයෝ දේවගණේ ච නාගේ
නුසාසයී යත්ථ යීතෝ මුනින්දෝ
සද්ධම්ම හේමද්ධජ හාසමානං
වන්දේ සිලාචේතිය මබ්හුතං තං.

16. කතරගම කිරිවෙහෙර
මුනින්දෝ නිසින්නෝ යහිං දේවතානං
සමේතාන මග්ගං සුදේසේසි ධම්මං
මහාසේන දේවස්ස සම්මානනීයං
නමේ කාචරග්ගමෙ ථූපස්ස ඨානං.

## ජත්ත මාණවක ගාථා

1 යෝ වදතං පවරෝ මනුජේසු
සක්‍යමුනී හගවා කතකිච්චෝ
පාරගතෝ බලවිරියසමංගී
තං සුගතං සරණත්තමුපේමි

2 රාගවිරාගමනේජමසෝකං
ධම්මමසංඛත මප්පටිකූලං
මධුරමිමං පගුණං සුවිහත්තං
ධම්මමිමං සරණත්තමුපේමි

3 යත්ථ ච දින්න මහප්ඵල මාහු
චතුසු සුචිසු පුරිසයුගේසු
අට්ඨ ච පුග්ගල ධම්මදසාතේ
සංඝමිමං සරණත්තමුපේමි

## සිංහල තේරුම්

1 කතාකරන මිනිසුන් අතර යම් ශ්‍රේෂ්ඨයෙක් වෙයිද, ඒ ජීවිතයේ අවබෝධ කරගත යුතු සියල්ල අවබෝධ කරගත් ශාක්‍ය මුනින්ද්‍ර වූ හාග්‍යවත් වහන්සේ ය. අනන්ත අප්‍රමාණ වීර්යයකින්, ධෛර්යයකින් සංසාරයෙන් එතෙරව වැඩි ඒ සුගතයන් වහන්සේව සාදරයෙන් සරණ යමි.

2 රාගය නැති කරන්නාවූ ශෝක රහිතවූ තෘෂ්ණාව රහිතවූ පිළිකුල් රහිතවූ අසංකතවූ නිර්වාණ ධර්මය මනා කොට ප්‍රගුණ කළහොත් අනන්ත සුන්දරත්වයෙක් සාක්ෂාත් කරන ඒ ධර්මය සාදරයෙන් සරණ යමි.

3 යම් කෙනෙකුට පිදීමෙන් මහත් ප්‍රතිඵල ලැබේද, ඒ පාරිශුද්ධ වූ මාර්ග ඵල ලාහී උත්තමයන් වහන්සේලා යුගල වශයෙන්වූ හතර දෙනාටයි. උන්වහන්සේලා පුද්ගලයන් වශයෙන් අටදෙනෙක් වේ. ඒ සංඝයා වහන්සේලා සාදරයෙන් සරණ යමි.

## ජය මංගල ගාථා

1 බාහුං සහස්ස මභිනිම්මිත සායුධං තං
ගිරිමේඛලං උදිත ඝෝර සසේන මාරං
දානාදිධම්ම විධිනා ජිතවා මුනින්දෝ
තං තේජසා භවතු මේ* ජයමංගලානි

2 මාරාතිරේක මභියුජ්ඣිත සබ්බරත්තිං
ඝෝරම්පනාළවකමක්ඛමථද්ධ යක්ඛං
ඛන්තී සුදන්ත විධිනා ජිතවා මුනින්දෝ
තං තේජසා භවතු මේ* ජයමංගලානි

3 නාළාගිරිං ගජවරං අතිමත්තභූතං
දාවග්ගි චක්ක මසනීව සුදාරුණං තං
මෙත්තං භූසේක විධිනා ජිතවා මුනින්දෝ
තං තේජසා භවතු මේ* ජයමංගලානි

4 උක්ඛිත්ත ඛග්ග මතිහත්ථ සුදාරුණං තං
ධාවං තියෝජන පථංගුලිමාලවන්තං
ඉද්ධීභිසංඛත මනෝ ජිතවා මුනින්දෝ
තං තේජසා භවතු මේ* ජයමංගලානි

5 කත්වාන කට්ඨමුදරං ඉව ගබ්භිනීයං
චිඤ්චාය දුට්ඨ වචනං ජනකාය මජ්ඣේ
සන්තේන සෝම විධිනා ජිතවා මුනින්දෝ
තං තේජසා භවතු මේ* ජයමංගලානි

6 සච්චං විහාය මති සච්චකවාදකේතුං
වාදාභිරෝපිත මනං අතිඅන්ධභූතං
පඤ්ඤ පදීප ජලිතෝ ජිතවා මුනින්දෝ
තං තේජසා භවතු මේ* ජයමංගලානි

7 නන්දෝපනන්ද භුජගං විබුධං මහිද්ධිං
පුත්තේන ථේර භුජගේන දමාපයන්තෝ
ඉද්ධූපදේස විධිනා ජිතවා මුනින්දෝ
තං තේජසා භවතු මේ* ජයමංගලානි

8 දුග්ගාහ දිට්ඨී භුජගේන සුදට්ඨ හත්ථං
බ්‍රහ්මං විසුද්ධි ජුතිමිද්ධි බකාභිධානං
ඤාණාගදේහ විධිනා ජිතවා මුනින්දෝ
තං තේජසා භවතු මේ* ජයමංගලානි

9 ඒතා'පි බුද්ධ ජයමංගල අට්ඨගාථා
යෝ වාචකෝ දින දිනේ සරතේ මතන්දී
හිත්වාන නේක විවිධානි චුපද්දවානි
මොක්ඛං සුඛං අධිගමෙය්‍ය නරෝ සපඤ්ඤෝ

* අනුන් වෙනුවෙන් කියන විට 'මේ' වෙනුවට 'තේ' යොදන්න



## සිංහල තේරුම්

1 දහක් දිලිසෙන අවිවලින් අත් මවා ගිරිමේඛලා
ඇත් රජුන් පිට ගොර මාර සේනා හා සමග
ආ මාරයා දන් පාරමී බලෙන් මුනින්ද දිනූසේක.
ඒ ආනුභාවෙන් ජයමඟුල් වේවා!.

2 මරුවෙක් වගේ වූ ආලවක යක්ෂයා ඉවසුම්
බලෙන් මුනින්ද දිනූසේක. ඒ ආනුභාවෙන්
ජයමඟුල් වේවා!.

3 ලැව් ගින්නක් මෙන් දරුණු වූ සුරාවෙන් මත් වූ
නාලාගිරි ඇත් රජු මෙත් බලෙන් මුනින්ද
දිනූසේක. ඒ ආනුභාවෙන් ජයමඟුල් වේවා!.

4 අතින් කඩුවක් ගෙන මහ මග දිගේ එලවූ
අංගුලිමාලයන් සිත්හි සමාධි බලෙන් මුනින්ද
දිනූසේක. ඒ ආනුභාවෙන් ජයමඟුල් වේවා!.

5 උදරයේ දර ලී බැඳ ගැබ්ගත් විලාසයෙන්
ජනකාය මැද දූන් නිගාවන් සන්සුන් ලෙසින්
ඉවසා මුනින්ද් දිනූසේක. ඒ ආනුභාවෙන්
ජයමඟුල් වේවා!.

6 මෝහෙන් මුලාවී වාදෙන් දිනන්නට ආ සච්චක ව
දල්වූ දිදුල් නැණ බලෙන් මුනින්ද දිනූසේක. ඒ
ආනුභාවෙන් ජයමඟුල් වේවා!.

7 නන්දෝපනන්ද නම් තෙද බලැති නා රජුන්
මුගලන් තෙරුන්ගේ මනා උපදෙසින් මුනින්ද
දිනූසේක. ඒ ආනුභාවෙන් ජයමඟුල් වේවා!.

8 වැරදි මතවල එල්බ ගැනීම නැමති නාගයා
විසින් දෂ්ඨ කරන ලද අත් ඇති බක නම්
බ්‍රහ්මණයන් මහා නැණ බලෙන් මුනින්ද
දිනූසේක. ඒ ආනුභාවෙන් ජයමඟුල් වේවා!.

9 මෙම ජයමංගල ගාථා අට යමෙක් දිනපතා
සැදැහෙන් කියමින් සිත්හි දරා ගනී නම් සියළු
උවදුරු දුරුවී සැපතින් පිරිගොස් සදතනික
මොක් සුවය ලැබේ.

ඒවං මේ සුතං ඒකං සමයං භගවා සාවත්ථියං
විහරති ජේතවනේ අනාථපිණ්ඩිකස්ස ආරාමේ,
අථඛෝ අඤ්ඤතරා දේවතා අභික්කන්තාය රත්තියා
අභික්කන්ත වණ්ණා කේවලකප්පං ජේතවනං
ඔභාසෙත්වා යේන භගවා තේනුපසංකම්,
උපසංකමිත්වා, භගවන්තං අභිවාදෙත්වා ඒකමන්තං
අට්ඨාසි ඒකමන්තං ඨිතා ඛෝ සා දේවතා භගවන්තං
ගාථාය අජ්ඣභාසි

මා විසින් මෙසේ අසන ලදී. එක් දවසක් බුදුරජ
තෙම සැවැත් නුවර ‘ජේතවන’ නම් වූ අනේ පිඩු
සිටුහුගේ විහාරයේ වාසය කරන කල්හි එක්තරා
දෙවියෙක් ඉකුත් රෑයෙහි ඉතා ලස්සණ සිවි පැහැ
ඇත්තේ සියලු දෙව්රම බබුලුවා වැඩවසන බුදුරජ
තෙම වෙත පැමිණ වැඳ එකත් පසක සිට බුදුරජහට
ගාථාවකින් මෙසේ කීය.

1 බහූදේවා මනුස්සාච - මංගලානි අචින්තයුං
ආකංඛමානා සොත්ථානං - බ්‍රෑහි මංගල මුත්තමං

1 තමන්ට දෙලොව හිත වූ කුසල් දහමුන්ගේ පැමිණීම
කැමති දෙවියෝද,මිනිස්සුද දියුණුවට හිත කරුණු සිතූහ
ඒ උතුම් මගුල් අපට අනුකම්පාවෙන් දෙසනු මැනවි.

2 අසේවනාච බාලානං - පණ්ඩිතානංච සේවනා
පූජාච පූජනීයානං - ඒතං මංගල මුත්තමං

2 අනුවණ සත්වයන් සේවනය නොකිරීමද,නුවණැත්තන්
සේවනය කිරීමද,පිදිය යුත්තන් පිදීමද උතුම් මඟුල්ය.

3 පතිරූපදේස වාසෝච - පුබ්බේ ච කතපුඤ්ඤතා
අත්තසම්මාපණිධිච - ඒතං මංගල මුත්තමං

3 සුදුසු දේශයක විසීමද,පෙර කරන ලද පින් ඇති බවද,
සිත මනාකොට පිහිටීමද මෙතෙම උතුම් මඟුල්ය.

4බාහු සච්චඤ්ච සිප්පඤ් ච-විනයෝ ච සුසික්ඛිතෝ
සුභාසිතා ච යා වාචා - ඒතං මංගල මුත්තමං

4 බහුශ්‍රැත භාවය නම්වූ උගත්කමද,ශිල්ප දැනීමද,
මනාකොට හික්මෙන ලද විනයද සුබැසි වචනයන්ද
මෙතෙම උතුම් මඟුල්ය.

5 මාතාපිතු උපට්ඨානං - පුත්තදාරස්ස සංඝහෝ
අනාකුලා ච කම්මන්තා - ඒතං මංගල මුත්තමං

5 මව්පියන්ට උවටැන් කිරීමද, අඹුදරුවන්ට සංග්‍රහ
කිරීමද,නිරවුල් කර්මාන්ත ඇති බවද මෙතෙම උතුම්
මඟුල්ය.

6 දානංච ධම්මචරියා ච - ඤාතකානඤ්ච සංඝහෝ
අනවජ්ජානි කම්මානි - ඒතං මංගල මුත්තමං

6 ආමිස දීමද ධර්මදානාදියද, දස කුසල්කම්හි හැසිරීමද,
නෑයන්ට සැලකීමද, නිවැරදි කර්මාන්ත කිරීමද
මෙතෙම උතුම් මඟුල්ය.

7 ආරති විරති පාපා - මජ්ජපානා ච සඤ්ඤමෝ
අප්පමාදෝ ච ධම්මේසු - ඒතං මංගල මුත්තමං

7 පව්කම්වල නොඇලීමද,අකුශල ක්‍රියා වලින් වැළැක්මද
මත්පැන් බීමෙන් වැළැක්මද,සියලු කුසල් දහම්හි පමා
නොවීමද මෙතෙම උතුම් මඟුල්ය.

8 ගරෙවෝච නිවාතෝච - සන්තුට්ඨී ච කතඤ්ඤුතා
කාලේන ධම්ම සවණං - ඒතං මංගල මුත්තමං

8 බුද්ධාදීන් කෙරෙහි ගරු කිරීමද,යටත්වූ පැවතුම් ඇති
බවද සතුට ඇති බවද,කළ කළෙහි ගුණ දන්නා
බවද,සුදුසු කාලයෙහි බණ ඇසීමද මෙතෙම උතුම්
මඟුල්ය.

9 ඛන්ති ච සෝවචස්සතා - සමණානංච දස්සනං
කාලේන ධම්ම සාකච්චා - ඒතං මංගල මුත්තමං

9 ඉවසීමද,කීකරු බවද, මහණ බමුණන්ගේ දැකීමද
සුදුසු කාලයෙහි ධර්මය පිළිබඳ සාකච්ඡා කිරීමද
මෙතෙම උතුම් මඟුල්ය.

10 තපෝච බ්‍රහ්මචරියා ච - අරිය සච්චාන දස්සනං
නිබ්බාන සච්ඡි කිරියා ච- ඒතං මංගල මුත්තමං

10 තපසද, උතුම් හැසිරීමද, ආර්‍ය සත්‍යයන් නුවණින්
දැකීමද, නිවන් අවබෝධ කිරීමද මෙතෙම උතුම්
මඟුල්ය.

11ඵුට්ඨස්ස ලෝකධම්මේහි-චිත්තං යස්ස න කම්පති
අසෝකං විරජං ඛේමං - ඒතං මංගල මුත්තමං

11 අටලෝ දහමින් මඩනා ලද්ද වූ යමෙකුගේ සිත නො
සැලේද,ශෝක නැති සිත ද, කෙලෙස් රජස් නැති
බිය නැති සිතද මෙතෙම උතුම් මඟුල්ය.

12 ඒතාදිසානි කත්වාන - සබ්බත්ථ මපරාජිතා
සබ්බත්ථ සොත්ථිං ගච්ඡන්ති තං - තේසං මංගල
මුත්තමං

12 මෙවැනි මංගලයන් කොට සියලු ඉරියව්වෙහි ම
උවදුරු නැත්තෝ වෙයි. හැමතන්හි සැපවත් බවට
යෙත්. ඔවුන්ගේ ඒ කරුණු තිස්අටම උතුම් මඟුල්ය.

<u>රතන සූත්‍රය</u>

1 යානීධ භූතානි සමාගතානි
භුම්මානි වා යානීව අන්තලික්ඛේ
සබ්බේව භූතා සුමනා භවන්තු
අථෝපි සක්කච්ච සුණන්තු භාසිතං

2 තස්මාහි භූතා නිසාමේථ සබ්බේ
මෙත්තං කරෝථ මානුසියා පජාය
දිවාච රත්තෝච හරන්ති යේ බලිං
තස්මා හි නේ රක්ඛථ අප්පමත්තා

3 යං කිඤ්චි විත්තං ඉධ වා හුරං වා
සග්ගේසුවායං රතනං පණීතං
නනෝසමං අත්ථි තථාගතේන
ඉදම්පි බුද්ධේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

4 ඛයං විරාගං අමතං පණීතං
යදජ්ඣගා සක්‍යමුනී සමාහිතෝ
න තේන ධම්මේන සමත්ථි කිඤ්චි
ඉදම්පි ධම්මේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

5 යං බුද්ධසෙට්ඨෝ පරිවණ්ණයී සුචිං
සමාධිමානන්තරිකඤ්ඤමාහු
සමාධිනාතේන සමෝ න විජ්ජති
ඉදම්පි ධම්මේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

6 යේ පුග්ගලා අට්ඨ සතං පසත්ථා
චත්තාරි ඒතානි යුගානි හොන්ති
තේ දක්ඛිණෙය්‍යා සුගතස්ස සාවකා
ඒතේසු දින්නානි මහප්ඵලානි
ඉදම්පි සංඝේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

7 යේ සුප්පයුත්තා මනසා දල්හේන
නික්කාමිනෝ ගෝතම සාසනම්හි
තේ පත්තිපත්තා අමතං විගය්හ
ලද්ධා මුධා නිබ්බුතිං භුඤ්ජමානා
ඉදම්පි සංඝේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

8 යථින්දඛීලෝ පඨවිංසිතෝසියා
චතුබ්භි වාතේහි අසම්ප කම්පියෝ
තථූපමං සප්පුරිසං වදාමි
යෝ අරියසච්චානි අවෙච්ච පස්සති
ඉදම්පි සංඝේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

9 යේ අරියසච්චානි විභාවයන්ති
ගම්භීර පඤ්ඤේන සුදේසිතානි
කිඤ්චාපි තේ හොන්ති භුසප්පමත්තා
න තේ භවං අට්ඨමං ආදියන්ති
ඉදම්පි සංඝේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

<u>සිංහල තේරුම්</u> 

1 මෙහි රැස්වූ අහසෙහි හෝ පොළොවෙහි හෝ
යම් භූතයෝ වේ නම් ඒ සියලු භූතයෝ
සැපතට පැමිණි සිත් ඇත්තෝ
වෙත්වා. සතුටින් මේ පිරිත් අසත්වා.

2 ඒ හැම දෙන මනුෂ්‍ය ප්‍රජාව කෙරෙහි මෙත් කරව්.
යම් මිනිස් කෙනෙක් දිවා රාත්‍රි දෙකෙහි
පූජාවන් කෙරෙත් ද ඔවුන් නොපමාව රකිව්.

3 මෙලොව පරලොව හෝ දෙව්ලොව යම් උතුම්
රුවනක් හෝ තථාගතයන් හා සම වුවක්
නොමැත. මෙයත් උතුම් බුදු ගුණයකි.
ඒ සත්‍යයෙන් සියලු සත්නට සෙත්ම වේවා!.

4 තථාගතයන් වහන්ස ඛය නම් වූද, විරාග නම්
වූද, අමත නම් වූද, උතුම් වූ යම් නිවණක්
ලැබූ සේක් ද ඒ නිර්වාණ ධර්මය හා සම වුවක්
නොමැත. මෙයත් උතුම් දහම් ගුණයකි.
ඒ සත්‍යයෙන් සියලු සත්නට සෙත්ම වේවා!.

5 උතුම් වූ බුදුරජ තෙම යම් සමාධියක්
පැසසූයේ ද, ඉතා පිරිසිදු වූ ඒ සමාධිය
ආනන්තරික සමාධිය යි, මෙයත් උතුම් දහම්
ගුණයකි. ඒ සත්‍යයෙන් සියලු සත්නට සෙත්ම වේවා!.

6 උතුමන් පසස්නා ලද යම් පුද්ගලයෝ අට දෙනෙක්
වෙත් ද, ඔවුහු යුගල වශයෙන් සතරක් වෙති.
බුදුන්ගේ සව් වූ උන්වහන්සේලා සිව් පසය
පිළිගැණීමට සුදුස්සෝ ය. ඔවුන් කෙරෙහි දෙන ලද
දෑ මහත් අනුසස් ඇත්තෝය. මෙයත් උතුම් සඟ
ගුණයකි. ඒ සත්‍යයෙන් සියලු සත්නට සෙත්ම වේවා!.

7 යමෙක් තම විදසුනෙහි සිත යොද ස්ථිර
සමාධියෙන් යුත් සිතින් කෙලෙසුන් කෙරෙන්
නික්මීම ඇත්තාහු ද ගොයුම් සසුනෙහි පැමිණිය
යුත්තට පැමිණ නිවණ සතුටින් විඳි ද මෙයත් සඟ
ගුණයකි. ඒ සත්‍යයෙන් සියලු සත්නට සෙත්ම වේවා!.

8 තිරසර ලෙසින් පොළොවේ සිටුවන ලද ඉන්ද්‍රඛීලය
යම්සේ සිව්දිගින් හමන සුළඟින් නොසෙළවිය
හැක්කේද, චතුරාර්‍ය සත්‍ය නුවණින් දකින උතුම්
පුරුෂයා ද එබඳුය. මෙයත් උතුම් සඟ ගුණයකි.
ඒ සත්‍යයෙන් සියලු සත්නට සෙත්ම වේවා!.

9 බුදුන්වහන්සේ විසින් මනාකොට දෙසන ලද සිව්සස්
ධර්මය ගැඹුරින් දත් සෝවාන් අයෙක් පමාවූ මුත්
අටවැනි උත්පත්තියක් නොගනී.
මෙයත් උතුම් සඟ ගුණයකි.
ඒ සත්‍යයෙන් සියලු සත්නට සෙත්ම වේවා!.

10 සහාවස්ස දස්සන සම්පදාය
තයස්සු ධම්මා ජහිතා භවන්ති
සක්කායදිට්ඨී විචිකිච්චිතඤ්ච
සීලබ්බතංවාපි යදත්ථි කිඤ්චි
චතූහපායේහි ච විප්පමුත්තෝ
ඡචාභිඨානානි අභබ්බෝ කාතුං
ඉදම්පි සංඝේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

11 කිඤ්චාපි සෝ කම්මං කරෝති පාපකං
කායේන වාචා උදචේත සාවා
අභබ්බෝ සෝ තස්ස පටිච්ඡාදාය
අභබ්බතා දිට්ඨපදස්ස වුත්තා
ඉදම්පි සංඝේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

12 වනප්ප ගුම්බේ යථාඵුස්සිතග්ගේ
ගිම්හානමාසේ පඨමස්මිං ගිම්හේ
තථූපමං ධම්මවරං අදේසයි
නිබ්බානගාමිං පරමං හිතාය
ඉදම්පි බුද්ධේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

13 වරෝ වරඤ්ඤූ වරදෝ වරාහරෝ
අනුත්තරෝ ධම්මවරං අදේසයී
ඉදම්පි බුද්ධේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

14 ඛීණං පුරාණං නවං නත්ථි සම්භවං
විරත්තචිත්තා ආයතිකේ භවස්මිං
තේ ඛීණබීජා අවිරුළ්හිච්ඡන්දා
නිබ්බන්ති ධීරා යථායම්පදීපෝ
ඉදම්පි සංඝේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

15 යානීධ භූතානි සමාගතානි
භුම්මානි වා යානිව අන්තලික්ඛේ
තථාගතං දේවමනුස්ස පූජිතං
බුද්ධං නමස්සාම සුවත්ථි හෝතු

16 යානීධ භූතානි සමාගතානි
භුම්මානි වා යානිව අන්තලික්ඛේ
තථාගතං දේවමනුස්ස පූජිතං
ධම්මං නමස්සාම සුවත්ථි හෝතු

17 යානීධ භූතානි සමාගතානි
භුම්මානි වා යානිව අන්තලික්ඛේ
තථාගතං දේවමනුස්ස පූජිතං
සංඝං නමස්සාම සුවත්ථි හෝතු

10 සෝවාන් වූ මොහුගේ කය පිළිබඳ විසි අයුරකින්
පැවති දෘෂ්ටියද, බුද්ධාදී අට තැනක පැවති
සැකයද ගෝසීල ගෝව්‍රතාදිය යන යම් කිසි
දෘෂ්ටියක්ද යන තුන් අකුශල ධර්මයෝ ප්‍රහීණ
වූවාහු වෙති. සතර අපායෙන් ද මිදුනේ වෙයි.
සය වැදෑරුම් මහ පව් කිරීමට නොයෙදේ.
මෙයත් උතුම් සඟ ගුණයකි.
ඒ සත්‍යයෙන් සියලු සත්නට සෙත්ම වේවා!.

11 සිත, කය හෝ වචනයෙන් කරන කිසියම් අකුසල්
සැඟවීම සෝවාන් වූවනට නුසුදුසුය. එයට හේතුව
නිවන් මග දක සිටීමය. මෙයත් උතුම් සඟ
ගුණයකි. ඒ සත්‍යයෙන් සියලු සත්නට සෙත්ම
වේවා!.

12 ගිමන් මාස අතුරෙහි පළමු වැනි ගිමන් මසෙහි
අතුරිකිලිවල සුපිපි මල් ඇති වන ලැහැබක් යම්
සේද, එවැනි නිවණට යන මග පෙන්වන්නාවූ
උතුම් ලොව්තුරා ධර්මය සත්වයන්ට හිත පිණිස
දේශනා කෙළේය. මෙයත් උතුම් බුදු ගුණයකි.
ඒ සත්‍යයෙන් සියලු සත්නට සෙත්ම වේවා!.

13 උතුම් වූ නිවණ දන්නා වූ දෙව් මිනිසුන්ට උතුම්
මාර්ගය එළවූවා වූ අනුත්තර වූ බුදුරජ තෙම උතුම්
ලොව්තුරා ධර්මය දෙසීය. මෙයත් උතුම් බුදු
ගුණයකි. ඒ සත්‍යයෙන් සියලු සත්නට සෙත්ම
වේවා!.

14 පැරණි කම් සහමුලින්ම සිඳින වත්මන් කම්
විපාක නොදේ. නැවත ඉපදුමෙහි ආසා නැත.
කෙලෙස් නැති එතුමෝ පහන් නිවිසේ නිවී සැනසේ.
මෙයත් උතුම් සඟ ගුණයකි.
ඒ සත්‍යයෙන් සියලු සත්නට සෙත්ම වේවා!.

15 මෙහි රැස්වූ අහසෙහි හෝ පොළොවෙහි හෝ යම්
භූතයෝ වේ නම් දෙව් මිනිසුන් විසින් පුදන ලද
තථාගත වූ බුදුන් වඳිමු.
ඒ සත්‍යයෙන් සියලු සත්නට සෙත්ම වේවා!.

16 මෙහි රැස්වූ අහසෙහි හෝ පොළොවෙහි හෝ යම්
භූතයෝ වේ නම් දෙව් මිනිසුන් විසින් පුදන ලද
ධර්මය වඳිමු. ඒ සත්‍යයෙන් සියලු සත්නට සෙත්ම
වේවා!.

17 මෙහි රැස්වූ අහසෙහි හෝ පොළොවෙහි හෝ යම්
භූතයෝ වේ නම් දෙව් මිනිසුන් විසින් පුදන ලද
සංඝයා වඳිමු. ඒ සත්‍යයෙන් සියලු සත්නට සෙත්ම
වේවා!.

# කරණීය මෙත්ත සූත්‍රය

1 කරණීය මත්ථ කුසලේන
යං තං සන්තං පදං අභිසමෙච්ච
සක්කෝ උජූච සූජූච
සුවචෝ චස්ස මුදු අනතිමානී

2 සන්තුස්ස කෝච සුභරෝච
අප්ප කිච්චෝච සල්ලහුකවුත්ති
සන්තින්ද්‍රියෝච නිපකෝච
අප්පගබ්බෝ කුලේසු අනනුගිද්ධෝ

3 නච ඛුද්දං සමාචරේ කිඤ්චියේන
විඤ්ඤූ පරේ උපවදෙය්‍යුං
සුඛිනෝවා ඛේමිනෝ හොන්තු
සබ්බේ සත්ථා භවන්තු සුඛිතත්ථා

4 යේ කේචි පාණ භූතත්ථි
තසාවා ථාවරා වා අනවසේසා
දීඝාවා යේ මහන්තාවා
මජ්ඣිමා රස්ස කාණුකථූලා

5 දිට්ඨා වා යේව අද්දිට්ඨා
යේච දූරේ වසන්ති අවිදූරේ
භූතාවා සම්භවේසී වා
සබ්බේ සත්ථා භවන්තු සුඛිතත්ථා

6 න පරෝ පරං නිකුබ්බේථ
නාති මඤ්ඤේථ කත්ථචි නං කඤ්චි
බ්‍යාරෝසනා පටිඝ සඤ්ඤා
නාඤ්ඤමඤ්ඤස්ස දුක්ඛ මිච්ඡෙය්‍ය

7 මාථා යථා නියං පුත්තං
ආයුසා ඒක පුත්ත මනුරක්ඛේ
ඒවම්පි සබ්බ භූතේසු
මාන සංභාවයේ අපරිමාණං

8 මෙත්තංච සබ්බ ලෝකස්මිං
මාන සම්භාවයේ අපරිමාණං
උද්ධං අධෝ ච තිරියංච
අසම්බාධං අවේරං අසපත්තං

9 තිට්ඨං චරං නිසින්නෝවා
සයානෝවා යාවතස්ස විගතමිද්ධෝ
එතං සතිං අධිට්ඨෙය්‍ය
බ්‍රහ්ම මේතං විහාරං ඉදමාහු

10 දිට්ඨිංච අනුපගම්ම සීලවා
දස්සනේන සම්පන්නෝ
කාමේසු විනෙය්‍ය ගේධං
නහී ජාතු ගබ්භසෙය්‍යං පුනරේතීති

## සිංහල තේරුම්

1 නිවන් ලැබ ගැනුමට යමක් කළ යුතු නම් දක්ෂයා
විසින් එය කළ යුතුය. හේ ඍජු වූවෙක්, මනාව
කෙලින් වූවෙක්, කීකරු වූවෙක් වේවා. නිහතමාන
ඇත්තෙක් ද වේවා!.

2 සතුටු වූවෙක්, පොෂණය කිරීමෙහි පහසු වූවෙක්,
අල්ප වැඩ ඇත්තෙක්, සැහැල්ලු පැවතුම් ඇත්තෙක්,
සන්හුන් ඉඳුරන් ඇත්තෙක්, නුවණ ඇත්තෙක්,
කුලයෙහි නො ඇලුනෙක් වේවා!.

3 නුවණ ඇති අයගේ දෙසට ලක්වන සුළු වරදක්
හෝ නොකරයි. සියළු සතුන් සැප ඇත්තෝ, බිය
උවදුරු නැත්තෝ වෙත්වා!. සැපවත් සිත්
ඇත්තෝ වෙත්වා!.

4 කෙලෙස් ඇති නැති සියළු පණ ඇති,
දිග සත්තු, මහත් සිරුරු ඇති, මැදුම් සිරුරු
ඇති, මිටි සත්තුද, වට සත්තුද,

5 ඇසට පෙනෙන, නොපෙනෙන, ළඟ මෙන්ම දුර
වසනා, උපන්නාවූ ද, උපදිමින් සිටිනා වූද සියලු
සත්වයෝ නිදුක් වෙත්වා!.

6 කිසි තැනක අනෙකෙක් අනෙකකු වංචා
නො කෙරේවා. ඒ කිසිවෙක් හට අවමන්
නො කෙරේවා. බැණීමෙන්ද කෝපයෙන්ද
ඔවුනොවුන්ගේ දුක කැමැති නො වේවා!.

7 මව් තොමෝ තමාගේ එකම පුතා ආයුෂයෙන්
රකීද ඒ මෙන් සියලු සතුන් කෙරෙහි
අප්‍රමාණ මෙත් සිත වඩන්නේය.

8 පමණක් නැති ගැහැට නැති, තරහ නැති,
සතුරන් නැති සිතෙහි වූ මෙත් සිත උඩ ද
යට ද සරස ද සියලු ලෝකයෙහි වඩන්නේය.
පතුරවන්නේ ය.

9 සිටින, ඇවිදින, හිඳින, නිදනා වේලෙහි යම් තාක්
කල් නොනිද සිටින තෙක් මේ මෙත් සිහිය
වඩන්නේය. මේ මෙත් විහරණය මේ සසුනෙහි
බඹ විහරණය යයි කියති.

10 දෘෂ්ටියට ද නො පැමිණ සිල් වත් ව දැකීමෙන්
යුක්ත වූයේ වස්තු කාමයෙහි ගිජු බව
සහමුලින් නැති කොට ඒකාන්තයෙන් මව් කුස
පිළිසිඳ ගැනීමට නැවත නො එන්නේය.

## මහා ජයමංගල ගාථා

1 මහා කාරුණිකෝ නාථෝ - හිතාය සබ්බපාණිනං
පූරෙත්වා පාරමී සබ්බා - පත්තෝ සම්බෝධිමුත්තමං
ඒතේන සච්චවජ්ජේන - හෝතු මේ ජයමංගලං

2 ජයන්තෝ බෝධියා මූලේ - සක්‍යානං නන්දිවද්ධනෝ
ඒවං මය්හං ජයෝ හෝතු - ජයස්සු ජයමංගලං

3 සක්කත්වා බුද්ධ රතනං - ඕසධං උත්තමං වරං
හිතං දේවමනුස්සානං - බුද්ධතේජේන සොත්ථිනා
නස්සන්තු පද්දවා සබ්බේ - දුක්ඛාවූපසමෙන්තු මේ

4 සක්කත්වා ධම්ම රතනං - ඕසධං උත්තමං වරං
පරිළාහූ පසමනං - ධම්මතේජේන සොත්ථිනා
නස්සන්තු පද්දවා සබ්බේ - භයාවූපසමෙන්තු මේ

5 සක්කත්වා සංඝ රතනං - ඕසධං උත්තමං වරං
ආහුනෙය්‍යං පාහුනෙය්‍යං - සංඝතේජේන සොත්ථිනා
නස්සන්තු පද්දවා සබ්බේ - රෝගාවූපසමෙන්තු මේ

6 යං කිඤ්චි රතනං ලෝකේ - විජ්ජති විවිධා පුථූ
රතනං බුද්ධ සමං නත්ථි - තස්මා සොත්ථී භවන්තු මේ

7 යං කිඤ්චි රතනං ලෝකේ - විජ්ජති විවිධා පුථූ
රතනං ධම්ම සමං නත්ථි - තස්මා සොත්ථී භවන්තු මේ

8 යං කිඤ්චි රතනං ලෝකේ - විජ්ජති විවිධා පුථූ
රතනං සංඝ සමං නත්ථි - තස්මා සොත්ථී භවන්තු මේ

9 නත්ථි මේ සරණං අඤ්ඤං - බුද්ධෝ මේ සරණං වරං
ඒතේන සච්චවජ්ජේන - හෝතු මේ ජයමංගලං

10 නත්ථි මේ සරණං අඤ්ඤං - ධම්මෝ මේ සරණං වරං
ඒතේන සච්චවජ්ජේන - හෝතු මේ ජයමංගලං

11 නත්ථි මේ සරණං අඤ්ඤං - සංඝෝ මේ සරණං වරං
ඒතේන සච්චවජ්ජේන - හෝතු මේ ජයමංගලං

12 සබ්බීතියෝ විවජ්ජන්තු - සබ්බරෝගා විනස්සතු
මා මේ භවත්වන්තරායෝ - සුඛී දීඝායුකෝ භවේ

13 භවතු සබ්බමංගලං - රක්ඛන්තු සබ්බ දේවතා
සබ්බ බුද්ධානුභාවේන - සදා සොත්ථී භවන්තු මේ

14 භවතු සබ්බමංගලං - රක්ඛන්තු සබ්බ දේවතා
සබ්බ ධම්මානුභාවේන - සදා සොත්ථී භවන්තු මේ

15 භවතු සබ්බමංගලං - රක්ඛන්තු සබ්බ දේවතා
සබ්බ සංඝානුභාවේන - සදා සොත්ථී භවන්තු මේ

16 නක්ඛත්තයක්ඛභූතානං - පාපග්ගහනිවාරණා
පරිත්තස්සානුභාවේන - හන්තු තේසං උපද්දවේ



## සිංහල තේරුම්

1 මහා කාරුණික බුදුරජාණන් වහන්සේ සියලු සත්වයන්ට හිත සුව පිණිස පාරමිතා පුරා බුදුබවට පැමිණිහ. ඒ සත්‍යයේ බලයෙන් මට ජය මංගලයක් වේවා!

2 ජය ශ්‍රී මහා බෝ මුලදී ශාක්‍ය තොමෝ මාර සේනා පරදවා ජය ලැබූ ආකාරයෙන් මට ද ජය ලැබේවා! ජය මංගලයක් වේවා!

3 දෙව් මිනිසුන්ට හිත සුව සලසන්නාවූ බුද්ධ රත්නය උතුම් බෙහෙතකි. ඒ තේජසින් මගේ සියලු උවදුරු නැසේවා! සියලු දුක් දුරුවේවා!

4 කෙලෙස් ගින්නෙන් ඇතිවන දැවිල්ල සංසිඳුවන ධර්ම රත්නය උතුම් බෙහෙතකි.ඒ තේජසින් මගේ සියලු උවදුරු නැසේවා! සියලු භය දුරු වේවා!

5 දුරසිට ගෙනවුත් පුදන සිව්පසය පිළිගැනීමට සුදුසු සංඝරත්නය උතුම් බෙහෙතකි, ඒ තේජසින් මගේ සියලු උවදුරු නැසේවා! සියලු රෝග දුරු වේවා!

6 මේ පෙළෝතලෙහි ඇති කිසිම වස්තුවක් බුද්ධ රත්නයට සම කළ නොහැක. ඒ සත්‍යයෙන් මට සියලු යහපත වේවා!

7 මේ පෙළෝතලෙහි ඇති කිසිම වස්තුවක් ධර්ම රත්නයට සම කළ නොහැක.ඒ සත්‍යයෙන් මට සියලු යහපත වේවා!

8 මේ පෙළෝතලෙහි ඇති කිසිම වස්තුවක් සංඝ රත්නයට සම කළ නොහැක.ඒ සත්‍යයෙන් මට සියලු යහපත වේවා!

9 බුදුරජාණන් වහන්සේ මට එකම සරණ වන සේක. අන් කිසිම සරණක් නැත. ඒ සත්‍යයේ බලයෙන් මට ජය මංගලයක් වේවා!

10 ධර්ම රත්නය මට එකම සරණ ය. අන් කිසිම සරණක් නැත. ඒ සත්‍යයේ බලයෙන් මට ජය මංගලයක් වේවා!

11 සංඝ රත්නය මට එකම සරණ ය. අන් කිසිම සරණක් නැත. ඒ සත්‍යයේ බලයෙන් මට ජය මංගලයක් වේවා!

12 සියලු උවදුරු දුරු වේවා! සියලු රෝග විනශ වේවා! කිසිම අනතුරක් නොවේවා ! දීර්ඝායුෂ සැප ලැබේවා !

13 හැම මංගලයක්ම වේවා! සියලු දෙවියෝ රකිත්වා ! සියලු බුදුවරුන්ගේ බලයෙන් මට සැම ද සුව සෙත් වේවා!

14 හැම මංගලයක්ම වේවා! සියලු දෙවියෝ රකිත්වා ! සියලු ධර්මරත්නයේ බලයෙන් මට සැම ද සුව සෙත් වේවා!

15 හැම මංගලයක්ම වේවා! සියලු දෙවියෝ රකිත්වා ! සියලු සංඝරත්නයේ බලයෙන් මට සැම ද සුව සෙත් වේවා!

16 නක්ෂත්‍ර ග්‍රහ අපලයන්ද යක්ෂභූතයන්ගෙන් හා පාපී ග්‍රහයන්ගෙන් වන දෝසයන් ද සියලු උපද්‍රවයන්ද පිරිතේ අනුහසින් දුරු වේවා!

## සෙත් ගාථා

1 යන්දුන්නිමිත්තං අවමංගලඤ්ච
යෝ චාමනාපෝ සකුණස්ස සද්දෝ
පාපග්ගහෝ දුස්සුපිනං අකන්තං
බුද්ධානුභාවේන විනාසමේන්තු

2 යන්දුන්නිමිත්තං අවමංගලඤ්ච
යෝ චාමනාපෝ සකුණස්ස සද්දෝ
පාපග්ගහෝ දුස්සුපිනං අකන්තං
ධම්මානුභාවේන විනාසමේන්තු

3 යන්දුන්නිමිත්තං අවමංගලඤ්ච
යෝ චාමනාපෝ සකුණස්ස සද්දෝ
පාපග්ගහෝ දුස්සුපිනං අකන්තං
සංඝානුභාවේන විනාසමේන්තු

4 සබ්බේ බුද්ධා බලප්පත්තා
පච්චේකානඤ්ච යං බලං
අරහන්තානඤ්ච තේජේන
රක්ඛං බන්දමි සබ්බසෝ

## සිංහල තේරුම්

1 දුර්නිමිති, අවමංගල, අයහපත් පක්ෂීන් හැඬූ හඬ,
පාප ග්‍රහ, දෝෂ, නරක හීන පෙනීම යන සියල්ල
බුද්ධානු භාවයෙන් විනාශ වෙත්වා!.

2 දුර්නිමිති, අවමංගල, අයහපත් පක්ෂීන් හැඬූ හඬ,
පාප ග්‍රහ, දෝෂ, නරක හීන පෙනීම යන සියල්ල
ධම්මානු භාවයෙන් විනාශ වෙත්වා!.

3 දුර්නිමිති, අවමංගල, අයහපත් පක්ෂීන් හැඬූ හඬ,
පාප ග්‍රහ, දෝෂ, නරක හීන පෙනීම යන සියල්ල
සංඝානු භාවයෙන් විනාශ වෙත්වා!.

4 සියලු බුදුවරුන්ගේ, පසේ බුදුවරුන්ගේ,
රහතුන්ගේ යම් බලයක් වේ නම් ඒ තේජසින්
හැම අයුරින්ම ආරක්ෂා කරත්වා!

| ජය පිරිත | සිංහල තේරුම් |
|---|---|
| සිරි ධිති මදි තෙජෝ | ශ්‍රී සෞභාග්‍ය ධෛර්‍ය බුද්ධි තේජස් ඇත්තාවූ ද |
| ජය සිද්ධි මහිද්දි මහා ගුණං | ජය සිද්ධි මහා ඉර්ධි මහා ගුණ ඇත්තාවූ ද |
| අපරිමිත පුඤ්ඤාධිකාරස්ස | අප්‍රමාණ පුණ්‍යසම්පත්තියක් ඇත්තාවූ ද |
| සබ්බන්තරාය නිවාරණ සමත්ථස්ස | සතලාන්තරාය දුරිභූත කිරීමේ ශක්තිය ඇත්තාවූ ද |
| භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස | ඒ භාග්‍යවත් අරහත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේගේ |
| ද්වත්තිංස මහාපුරිසලක්ඛනානු භාවෙන | දෙතිස් මහා පුරිස් ලකුණු අනුහසින් ද |
| අසීත්‍යානුබ්‍යඤ්ජනලක්ඛනානු භාවෙන | අසූ අනුව්‍යඤ්ජන ලකුණු අනුහසින් ද |
| අට්ඨුත්තරසතමංගලලක්ඛනානු භාවෙන | එකසිය අටක් මඟුල් ලකුණු අනුහසින් ද |
| ඡබ්බණ්ණරංස්‍යානු භාවෙන | සවණක් ඝණ බුදුරැස් අනුහසින් ද |
| කෙතුමාලානුභාවෙන | කේතුමාලාවේ අනුහසින් ද |
| දසපාරමිතානු භාවෙන | දස පාරමිතාවන්ගේ අනුහසින් ද |
| දසඋපපාරමිතානු භාවෙන | දස උප පාරමිතාවන්ගේ අනුහසින් ද |
| දසපරමත්ථ පාරමිතානු භාවෙන | දස පරමත්ථ පාරමිතාවන්ගේ අනුහසින් ද |
| සීලසමාධිපඤ්ඤානු භාවෙන | සීල සමාධි පඤ්ඤාවන්ගේ අනුහසින් ද |
| බුද්ධානු භාවෙන | සම්බුදුරදුන්ගේ අනුහසින් ද |
| ධම්මානු භාවෙන | සදහම් බලයේ අනුහසින් ද |
| සංඝානු භාවෙන | මහ සඟරුවනේ අනුහසින් ද |
| තේජානු භාවෙන | තේජස්වල අනුහසින් ද |
| ඉද්ධානු භාවෙන | ඉර්ධිවල අනුහසින් ද |
| බලානු භාවෙන | බලපරාක්‍රමයේ අනුහසින් ද |
| ඤෙය්‍යධම්මානු භාවෙන | දැනගතයුතු ධර්මයේ අනුහසින් ද |
| චතුරාසීතිසහස්ස ධම්මක්ඛන්ධානු භාවෙන | අසූහාර දහසක් ධර්මස්කන්ධයේ අනුහසින් ද |
| නවලොකොත්තර ධම්මානු භාවෙන | නව ලෝකෝත්තර ධර්මයේ අනුහසින් ද |
| අට්ඨංගිකමග්ගානු භාවෙන | ආර්‍ය අෂ්ටාංගික මාර්ගයේ අනුහසින් ද |
| අට්ඨසමාපත්‍යානු භාවෙන | අටසමවත් අනුහසින් ද |
| ඡළභිඤ්ඤානු භාවෙන | ෂඩ් අභිඥාවන්ගේ අනුහසින් ද |
| මෙත්තා කරුණා මුදිතා උපෙක්ඛානු භාවෙන | මෛත්‍රී කරුණා මුදිතා උපේක්ෂා ගුණ අනුහසින් ද |
| සබ්බපාරමිතානු භාවෙන | සියලු පාරමිතාවන්ගේ අනුහසින් ද |
| රතනත්තයසරණානු භාවෙන | තෙරුවන් සරණේ අනුහසින් ද |
| මයිහං * | මාගේ |
| සබ්බ රොග | සියළු රෝගයන් ද |
| සොක උපද්දව | සියළු ශෝකයන් ද සියළු උවදුරු ද |
| දුක්ඛ දෝමනස්සු පායාසා විනස්සන්තු | සියළු දුක් දොම්නස් ද දුරුවේවා! |
| සබ්බ සංකප්පා මයිහං* සමිජ්ජන්තු | මාගේ සියළු පැතුම් ඉටුවේවා |
| දීඝායුකෝ හෝතු සතවස්සජීවේන සමංගිකෝ හෝතු සබ්බදා | දීර්ඝායුෂ ලබා සියවසක් ජීවත්වීමේ වාසනාව උදාවේවා! |
| ආකාස පබ්බත වන භූමි තටාක | අහස, පර්වත, වන භූමි,තටාකයන්හි ද |
| ගංගා මහා සමුද්ද ආරක්ඛක දේවතා | ගංගා හා මහා සමුද්‍රයන්හි ද ආරක්ෂක දෙවිදේවතාවෝ |
| සදා අම්හෙ* අනුරක්ඛන්තු | සැමදා මා රකීවා ! |
| සබ්බ බුද්ධානුභාවෙන | සියළු බුදු බලයෙන් ද |
| සබ්බ ධම්මානුභාවෙන | සියළු සදහම් බලයෙන් ද |
| සබ්බ සංඝානුභාවෙන | සියළු සඟසරණින් ද |
| බුද්ධරතනං ධම්මරතනං සංඝරතනං තිණ්ණං රතනානං ආනුභාවෙන | බුදු දම් සඟ යන රතනත්‍රයේ බලයෙන් ද |
| චතුරාසීති සහස්ස ධම්මක්ඛන්ධානුභාවෙන | අසූහාර දහසක් ධර්මස්කන්ධයේ බලයෙන් ද |
| පිටකත්තයානුභාවෙන | තුන් පිටකයේ බලයෙන් ද |
| ජිනසාවකානුභාවෙන | බුද්ධ ශ්‍රාවකයන්ගේ බලයෙන් ද |
| සබ්බේ මේ* රොගා | මාගේ සියළු රෝග ද |
| සබ්බේ මේ* භයා | මාගේ සියළු බිය ද |
| සබ්බේ මේ* අන්තරායා | මාගේ සියළු රෝග අන්තරායන් ද |
| සබ්බේ මේ* උපද්දවා | මාගේ සියළු උවදුරු ද |
| සබ්බේ මේ* දුන්නිමිත්තා | මාගේ සියළු අසුබ නිමිති ද |
| සබ්බේ මේ* අවමංගලා විනස්සන්තු | මාගේ සියළු අවමංගලයන් ද විනාශ වේවා! |

| | |
|---|---|
| ආයවඩ්ඪකො | ආයු වැඩිවේවා |
| ධනවඩ්ඪකො | ධනය වැඩිවේවා |
| සිරිවඩ්ඪකො | සිරිය වැඩිවේවා |
| යසවඩ්ඪකො | යසස වැඩිවේවා |
| බලවඩ්ඪකෝ | බලය වැඩිවේවා |
| වණ්ණවඩ්ඪකෝ | පැහැය වැඩිවේවා |
| සුඛවඩ්ඪකො හෝතු සබ්බදා | සැපය වැඩිවේවා! ජයම වේවා! |
| දුක්ඛ රොග භයා වෙරා | සියළු දුක් රෝ බිය වෛරය |
| සොකා සබ්බෙ උපද්දවා | සෝක උවදුරු |
| අනෙකා අන්තරායාපි විනස්සන්තුව තෙජසා | අනේක අනතුරු දුරුවේවා! සාමය ලැබේවා! |
| ජයසිද්ධි ධනං ලාභෝ | ජය ධන ලාභ |
| සොත්ථි භාග්‍යං සුඛං බලං | යහපත සැප බලය |
| සිරි ආයු ච වණ්ණෝච | සිරිය ආයුස සිරුර පැහැය |
| භෝගවුද්ධි ච යසවා | සම්පත යසස දියුණුව |
| සතවස්සෝ ච ආයු ච | සියවස් ආයු ලැබ |
| ජීව සිද්ධි භවන්තු මේ* | මා නිබඳව සැරදේවා! |

*** අනුත් වෙනුවෙන් කියන විට ‘මේ’ වෙනුවට ‘තේ’ ද ‘අම්හේ’ වෙනුවට ‘තුම්හේ’ ද යොදන්න**

## අටවිසි පිරිත

1 තණ්හංකරෝ මහා වීරෝ
මේධංකරෝ මහායසෝ
සරණංකරෝ ලෝකහිතෝ
දීපංකරෝ ජුතින්ධරෝ

2 කොණ්ඩඤ්ඤෝ ජනපාමොක්ඛෝ
මංගලෝ පුරිසාසභෝ
සුමනෝ සුමනෝ ධීරෝ
රේවතෝ රතිවද්ධනෝ

3 සෝභිතෝ ගුණසම්පන්නෝ
අනෝමදස්සී ජනුත්තමෝ
පදුමෝ ලෝකපජ්ජෝතෝ
නාරදෝ වරසාරථී

4 පදුමුත්තරෝ සත්තසාරෝ
සුමේධෝ අග්ගපුග්ගලෝ
සුජාතෝ සබ්බලෝකග්ගෝ
පියදස්සී නරාසභෝ

5 අත්ථදස්සී කාරුණිකෝ
ධම්මදස්සී තමෝනුදෝ
සිද්ධත්ථෝ අසමෝ ලෝකේ
තිස්සෝ වරදසංවරෝ

6 ඵුස්සෝ වරදසම්බුද්ධෝ
විපස්සීච අනූපමෝ
සිඛී සබ්බහිතෝ සත්ථා
වෙස්සභූ සුඛදයකෝ

7 කකුසන්ධෝ සත්ථවාහෝ
කෝණාගමනෝ රණඤ්ජහෝ
කස්සපෝ සිරිසම්පන්නෝ
ගෝතමෝ සක්‍යපුංගවෝ

8 අට්ඨ වීසති මේ බුද්ධා
පූරෙත්වා දස පාරමී
ජෙත්වා මාරාරි සංගාමං
බුද්ධත්තං සමුපාගමුං

9 තේසං සච්චේන සීලේන
ඛන්ති මෙත්ත බලේන ච
තේපි මං අනුරක්ඛන්තු
ආරෝග්‍යෙන සුඛේන ච

## සිංහල තේරුම්

1 තණ්හංකර මුනි වීර ගුණෙන් යුතුයි
මේධංකර මුනි කිත් යසසින් යුතුයි
සරණංකර මුනි ලොවට හිතැතිය
දීපංකර මුනි රුස් ධාරාවෙන් යුතුයි

2 කොණ්ඩඤ්ඤ මුනි ජනයාට අධිපතිය
මංගල මුනි මිනිස් බවින් අගතැන්
සුමන මුනි හොඳ හිත හා දිරිය ඇතිය
රේවත මුනි රති වඩවයි

3 සෝභිත මුනි ගුණයෙන් සම්පන්නයි
අනෝමදස්සී මුනි දන උතුම්
පදුම මුනි ලොව පහනක් වැනිය
නාරද මුනි උතුම් මග පෙන්වයි

4 පදුමුත්තර මුනි සත් හර වැන්නේය
සුමේධ මුනි පුද්ගල අගතැන්
සුජාත මුනි ලෙකෙට අග වෙයි
පියදස්සී මුනි සෙට නර වෙයි

5 අත්ථදස්සී මුනි කාරුණාගුණයෙන් යුක්තයි
ධම්මදස්සී මුනි අඳුර දුරරයි
සිද්ධත්ථ මුනිට සමකෙක් ලොව නැත
තිස්ස මුනි වර දෙන සංවරය

6 ඵුස්ස මුනි නිවණ දෙන්නේය
විපස්සීව මුනි අසමය
සිඛී මුනි හැමට හිතයි
වෙස්සභූ මුනි සැප ගෙන දේ

7 කකුසඳ බුදු නියක වන්නේය
කෝණාගමන බුදු නෙලෙස් හරින්නේය
කස්සප බුදු සිරියෙන් සම්පන්නය
ගෝතම බුදු සැකිකුල සෙට වන්නේය

8 මෙම අටවිසි බුදුවරු
දසපාරමී ගුණයෙන් සපිරේ
කෙලෙස් මරුන් ජය ගෙන
සම්බුදු වන්නේය

9 ඒ බුදුවරුන්ගේ සීලයේ බලයෙන් ද ඉවසුම්
මෙත් කරුණා ගුණයෙන් ද නිදුක් නිරෝගීව
ජීවත්වන්නට ආරක්ෂාව ලැබේවා!

## චූල ජිනපඤ්ජරය( දස දිසා පිරිත)

1 දිසාසු දස හාගේසු - ඨිතා බුද්ධානු හාවතෝ
වේරාපි අන්තරායාපි - විනස්සන්තු අසේසතෝ
ඒව මාදී ගුණෝපේතං - පරිත්තං තං හණාමහේ

2 පදුමුත්තරෝ පුරත්ථි මායං - අග්ගිම්හිවේච රේවතෝ
දක්ඛිණේ කස්සපෝ බුද්ධෝ - තිරිතේ ච සුමංගලෝ
පච්ජිමේ ච සීඛී බුද්ධෝ - වායව්‍යා මේධංකරෝ

3 උත්තරෝ පියදස්සී ච - ර්ශානේ දීපංකරෝ
පඨව්‍යා කකුසන්ධෝ ච - ආකාසේ සරණංකරෝ
අච්චන්තරායා සබ්බේ තේ - සෝක රොගා හයාපි ච
විනස්සන්තු සද තුය්හං - සබ්බීරියා පථේසු ච

4 යක්ඛාදි දේවතාහි ච - රාජ චෝරාහි අග්ගිහි
අමුනුස්සේහි සබ්බේහි - තිරච්ජාන ගතේහි ච
ජාතා උපද්දවා සබ්බේ - විනස්සන්තු අසේසතෝ

5 සිරස්මිං තේ බුද්ධ සෙට්ඨෝ-සාරිපුත්තෝ ච දක්ඛිණෝ
පච්චිමේ තව ආනන්දෝ - චතුද්දිසා ඛිණාසවා
සමන්තා ලෝකපාලා ච - ඉන්ද දේවෝ ච බ්‍රහ්ම ච
ඒතේසං ආනුභාවේන - සබ්බූපද්ද මූපද්දවා
අනේකා අන්තරා යාපි - විනස්සන්තු අසේසතෝ

## සිංහල තේරුම්

1දස දිසාවන්හි සිටියාවූ බුදුවරුන්ගේ ආනුභාවයෙන් වෛරයෝද අනතුරුද ඉතිරි නැතිව විනාශ වෙත්වා මේ ගුණ වලින් යුතු පිරිතක් කියනු ලැබේ.

2 උතුම්වූ පදුම බුදුන් නැගෙණහිර දිශාවෙන්ද,ගිණි කොණින් රේවත බුදුන්ද, කාශ්‍යප බුදුන් දකුණින්ද මංගල බුදුන් නිරිතෙන්ද, සිඛි බුදුන් බටහිරෙන් ද, වයඹින් මේධංකර බුදුන් ද වැඩසිටිති.

3 උතුරින් පියදස්සී බුදුන් ද, ර්සානෙන් දීපංකර බුදුන් ද, පොලොවෙහි කකුසද බුදුන් ද, අහසෙහි සරණංකර බුදුන්ද වැඩසිටිති. ඒ සියලු බුදුවරුන්ගේ ආනුභාවයෙන් සියලු අනතුරු, ශෝක, රෝග, හය ආදිය විනාශවේවා!

4 යක්ෂ,දේව,රජ, සොර සතුරු ගිනි ආදියෙන් ඇති වන උවදුරුද, අමනුෂ්‍යන්ගෙන්, තිරිසන් සත්වයින් ගෙන්, සියළු ඉරියව් පැවැත්මෙන් ඇතිවන උවදුරුද විනාශවේවා!.

5 ඔබ සිරසෙහි ඒ උතුම් බුදුරජාණන් වහන්සේය. දකුණත සැරියුත් රහතන්, පිටුපස ආනන්ද තෙරුන්වේ. හැම අතින්ම ලෝක පාලක ඉන්ද්‍ර දෙවි යා හා බ්‍රහ්මයාය. මේ සියල්ලන්ගේ ආනුභාවයෙන් සියලු උපද්‍රවයෝද ඉතිරි නැතිව විනාශ වේවා!.

චතුවිසති බුද්ධොති යො භවිස්සති උත්තමං
පාරමි බල පුත්තෙහි ජල නන්දන උත්තමං

අනොමානි ජලං තීරෙ උත්තමං පත්ත චීවරේ
පාරමී තෙ ජලං හොති සර්ව බන්ධන ජෙදනං

ආනන්දෙති මහා ථෙරං උත්තමං ධම්ම භණ්ඩකං
යෙන භික්ඛු මහා ථෙරං සයනෙ බන්ධන විධිවංසනං

ඉති ශ්‍රී ලෝක බුඬෙහී යෙන ධම්මානු භාවතො
යත්ත මන්ත හරං කත්වා වාතාසං බුද්ධානු භාවතො

මුනින්දො හොති නමො බුද්ධං මාරසෙනා පවජ්ජති
දසකොටි සහස්සානි සර්ව බන්ධන ජෙදනං

පාරමිතා ගුණො හොන්ති සො භවිස්සති උත්තමං
අනෙක ජාති සංසාරං සහස්සං ධම්මානුභාවතො

සයානො වා සහස්සානි උත්තමං ගුණ පුග්ගලො
අසීතිං තෙන සබ්බේපි සබ්බසිද්ධි භවන්තු මේ

අසීතිං දස තෙජෙන සර්ව භය විනාසනං
සර්ව රෝග විනස්සන්තු හිර බන්ධන ජෙදනං

යක්ඛ භූත පිසාචාත්ම ග්‍රහ දෝෂ විනාසනං
නමස්තු තෙ බුඩරාජා සබ්බන්තරාය විනස්සතු

| | |
|---|---|
| 1 පූරෙන්තා පාරමී සබ්බේ - සබ්බේ පච්චේක නායකා<br>සීවලීගුණතේජේන - පරිත්තං තං භණාමහේ<br>න ජාලිතී තී ජාලිතාමි - ආ, ඊ, ඌ, ආම් ඉ ස්වාහා<br>බුද්ධසාමි බුද්ධසත්‍යාමි | 1 සියලු පාරමිතාවන් සම්පූර්ණ කොට සියලු ධර්මයන් අවබෝධ කර ගත්තාවූ ඒ සීවලී මහ රහතන් වහන්සේගේ ගුණ තේජානුභාවයෙන් මේ පිරිත් අසන්නෙමු. |
| 2 පදුමුත්තරෝ නාම ජිනෝ - සබ්බ ධම්මේසු චක්ඛුමා<br>ඉතෝ සතසහස්සම්හි - කප්පේ උප්පජ්ජි නායකො | 2 මෙයින් කල්ප සිය දහසකට පෙර සියලු ධර්මයන් දත් නායකවූ පදුමුත්තර නම් බුදුරදුන් උපන්නේය. |
| 3 සීවලීච මහා ථේරෝ - සෝ රහෝ පච්චයාදිනං<br>පියෝ දේව මනුස්සානං - පියෝ බ්‍රාහ්මණ මුත්තමෝ<br>පියෝ නාග සුපණ්ණා නං - පිණින්ද්‍රියං නමා මහං | 3 සීවලී මහතෙරුන් ප්‍රත්‍යලාභීන් අතර අග්‍රස්ථානයට සුදුසු විය. දෙව් මිනිසුන්ට ප්‍රිය විය.බ්‍රාහ්මයන් අතර උතුම් විය. නාග සුපර්ණාදීන්ටද ප්‍රිය විය. ප්‍රසන්නවූ ඉදුරන් ඇති උන්වහන්සේට ද මම වඳිමි. |
| 4 නාසං සිමෝච මො සීසං - නානාජාලිතී සඤ්ජලිං<br>සදේව මනුස්සපූජිතං - සබ්බ ලාභා උපෙන්තු මේ | 4 සීවලී මහරහතන් වහන්සේව සියලු දෙවියන් හා මිනිසුන් විසින් පුදන ලදී. මට සියලු ලාභයන් වේවා. |
| 5 සත්තා හං ද්වාර මුල්හෝ හං - මහාදුක්ඛ සමප්පිතෝ<br>මාතා මේ ඡන්ද දනෙන - ඒවමාසී සුදුක්ඛිතා | 5 සත් දිනක් මහා දුකකින් මවු කුස හොත්තාවූ මම මව් පැවිදිවීම සදහා කැමැත්තදීම නිසා මහා දුකකින් මිදුනෙමි. |
| 6 කේසේසු ඡිජ්ජ මානෙසු - අරහත්තමපාපුණි<br>දේවා නාගා මනුස්සා ච - පච්චයානු' පනෙන්තිමං | 6 කෙස් කපන කල්හිම රහත්භාවයට පත්වීමි. දෙව් මිනිසුන් සමූහයා වෙතද මා විසින් ප්‍රත්‍යයෙන් අනුග්‍රහ කරන ලදී. |
| 7 පදුමුත්තර නාමකඤ්ච - විපස්සිං ච විනායකං<br>සංපූජයිං පමුදිතො - පච්චයේහි විසේසතෝ | 7 පදුමුත්තර නම්වුද, විපස්සි නම්වුද, නායකයන් වහන්සේලා විශේෂ වූ ප්‍රත්‍යයෙන් පමුදිත වූ මා විසින් පුදන ලදී. |
| 8 තතෝ තේසං විසේසේන - කම්මානං විපුලුත්තමං<br>ලාභං ලභාමි සබ්බත්ථ - වනේ ගාමේ ජලේ ථලේ | 8 ඒ විශේෂ වූ උන්වහන්සේලාට කළවූ මහත්වූ උතුම් කර්මයේ පලයෙන්ද වනයෙහි ගමෙහි ජලයෙහි ගොඩබිමෙහි හා හැමතැනම ප්‍රත්‍ය ලබමි. |
| 9 තදා දේවෝපනීතේහි - මමත්ථාය මහාමති<br>පච්චයේහි මහාවීරෝ - සසංඝෝ ලෝකනායකෝ | 9 එකල්හි ලෝක නායකවූ මහ සඟරුවන සහිතවූ මහ නුවණැති මහා වීරයන්වූ ලෝක නායකයන් වෙත පැමිණියෙමි. |
| 10 උපට්ඨිතෝ මයා බුද්ධෝ - ගන්ත්වා රේවතමද්දස්ස<br>තතෝ ජේතවනං ගන්ත්වා - ඒතදග්ගේ ඨපේසි මං | 10 පසුව ජේතවනාරාමයට ගියාවූ මා රේවත භික්පුව දුටුවෙමි. අනතුරුව බුදුරදුන් විසින් මා ද අග්‍ර ස්ථානයෙහි තැබූ සේක. |
| 11 රේවතං දස්සනත්ථාය - යදා යාති විනායකෝ<br>තිංසභික්ඛුසහස්සේහි - සහ ලෝකග්ගනායකෝ | 11 ලෝකනායකයන් වහන්සේ යම් කලෙක රේවත භික්පුව දැකීමට යාම පිණිස තිස් දහසක් භික්පුන් සමග මගට පිළිපන්නේ ය |
| 12 ලාභීනං සීවලී අග්ගෝ - මම සිස්සේසු භික්ඛවෝ<br>සබ්බලෝකහිතෝ සත්තා - කිත්තයී පරිසාසු මං | 12 සියලු ලෝකයාට හිත පිණිස ශාස්තෲන් වහන්සේ මහණෙනි මාගේ සිසුන් අතර ලාභීන්ගෙන් සීවලී අග්‍රවන්නේයැයි පිරිස මැද ගුණ කීර්තිය ප්‍රකටකළහ |
| 13 කිලේසා ඣාපිතා මය්හං - භවා සබ්බේ සමූහතා<br>නාගෝව බන්ධනං ඡෙත්වා - විහරාමි අනාසවෝ | 13 ම විසින් කෙලෙස් සිඳින ලද්දේ භවයෙන් සියලු කෙලෙස් නැසූයේ අනාශ්‍රව වූයේ රහත්ව සසර සියලු බැමි සිඳ වාසය කරමි. |
| 14 ස්වාගතං වත මේ ආසී - බුද්ධ සෙට්ඨස්ස සන්තිකං<br>තිස්සෝ විජ්ජා අනුප්පත්තෝ - කතං බුද්ධස්ස සාසනං | 14 බුද්ධ ශ්‍රේෂ්ඨයකි වහන්සේගේ සමීපයට මනාව මම පැමිණියෙමි. ත්‍රි විද්‍යාවට පත්වූ මා සියලු බුදු සසුන් කිස නිමවන ලදී. |
| 15 පටිසම්භිදා චතස්සෝ ච - විමොක්ඛාපී ච අට්ඨමෝ<br>ඡළභිඤ්ඤා සච්ඡිකථා - කතං බුද්ධස්ස සාසනං | 15 සිවු පිළිඹියාවන් හා අෂ්ට විමෝක්ෂයන් ද අභිඥාද ලාභීවූ මා විසින් සියලු බුදු සසුන් කිස නිමවන ලදී . |

16 බුද්ධපුත්තෝ මහාථේරෝ - සීවලී ජින සාවකෝ
උග්ගතේජෝ මහා වීරෝ - තේජසා ජින සාසනං

16 බුදු පුත්වූ ජින ශ්‍රාවකවූ සීවලී මහ තෙරුන්
විසින් උග්‍ර තෙජස් ඇති මහා වීරයන්
වහන්සේගේ බුදු සසුන බබලවන ලදී.

17 රක්ඛන්තා සීලතෙජේන - ධන වන්තෝ යසස්සිනෝ
ඒවං තේජා'නුභාවේන - සද රක්ඛන්තු සීවලී

17 සීවලී මා හිමියන්ගේ රකින ලද සීල හොඳින්
ධනවත් යසස්වී රකිනු ලබන්නේ සීවලී මහ රහත්
බලයෙන් හා එම තෙජානුභාවයෙන් මා සදා රකීවා

18 කප්පඨායිති බුද්ධස්ස - බෝධිමූලේ නිසීදයි
මාරසේනප්ප මද්දන්තෝ - සද රක්ඛන්තු සීවලී

18 බෝමුල වැඩ හිඳි මරසෙන් පරදවා ඒ බුදුතේජස
කල්පයක් පවතින්නේ යැයි කියනු ලබන සත්‍ය
බලයෙනුත් සීවලී මහ රහත් බලයෙනුත් මා රකීවා!

19 දස පාරමී තප්පත්තෝ - පබ්බජි ජින සාසනේ
ගෝතම සාක්‍ය පුත්තෝසි - ථේරේන මම සීවලී

19 දස පෙරුම් පිරුවාවූ බුදු සසුනෙහි පැවිදි
වූවෙමි. ගෞතම ශාක්‍ය පුත්‍රවූවෙහිය. මම සිවලී
තෙරුන් වෙමි.

20 මහා සාවකා අසීතිංසු - පුණ්ණත්ථේරෝ යසස්සිසෝ
භව බෝගේ අග්ග ලාභීසු - උත්තමෝ තේන සීවලී

20 අසූ මහා ශ්‍රාවක පුණ්ණ තෙරුන් යසසින් අග්‍ර
වූහ. භව භෝග ලාභීන් අතර සීවලී මහ තෙරුන්
වහන්සේ උතුම් විය.

21 ඒවං අචින්තියා බුද්ධා - බුද්ධ ධම්ම අචින්තියා
අචින්තියේසු පසන්නානං - විපාකෝ හෝති අචින්තියෝ

21 බුද්ධ විෂය අචින්ත්‍යය(නොසිතිය නොහැක),
ධර්මයද අචින්ත්‍යය. අතිශයින් එහි ප්‍රසන්න වූවහු
ගේ විපාකයද අචින්ත්‍යය.

22 තේසං සච්චේන සීලේන - ඛන්ති මෙත්ත බලේනව
තේපි මං (ත්වං) අනුරක්ඛන්තු - සබ්බ දුක්ඛ විනාසනං

22 උන්වහන්සේලා ගේ සත්‍ය වූ සීල බලයෙන් ද
ඉවසීම, මෛත්‍රී බලයෙන්ද සියලු දුක් නසා මා
රකින්වා !

23 තේසං සච්චේන සීලේන - ඛන්ති මෙත්ත බලේනව
තේපි මං (ත්වං) අනුරක්ඛන්තු - සබ්බ භය විනාසනං

23 උන්වහන්සේලා ගේ සත්‍ය වූ සීල බලයෙන් ද
ඉවසීම, මෛත්‍රී බලයෙන්ද සියලු භය නසා මා
රකින්වා !

24 තේසං සච්චේන සීලේන - ඛන්ති මෙත්ත බලේනව
තේපි මං (ත්වං) අනුරක්ඛන්තු - සබ්බ රෝග විනාසනං

24 උන්වහන්සේලා ගේ සත්‍ය වූ සීල බලයෙන් ද
ඉවසීම, මෛත්‍රී බලයෙන්ද සියලු රෝග නසා මා
රකින්වා !

## බොජ්ඣංග පිරිත

1 සංසාරේ සංසරන්තානං, සබ්බදුක්ඛ විනාසකේ
සත්තධම්මෙ ච බොජ්ඣංගේ, මාරසේනප්පමද්දිනෝ

2 බුජ්ඣිත්වා යේපිමේ සත්තා, තිභවා මුත්තා හි උත්තමා,
අජාතිං අජරබ්‍යාධිං, අමතං නිබ්භයං ගතා

3 එවමාදිගුණෝපේතං, අනේකගුණසංගහං,
ඕසධංච ඉමං මන්තං, බොජ්ඣංගං තං භණාමහේ

4 බොජ්ඣංගො සතිසංඛාතෝ, ධම්මානං විචයෝ තථා,
විරියං පීති පස්සද්ධි බොජ්ඣංගා ච තතෝපරේ

5 සමාධුපෙක්ඛා බොජ්ඣංගා, සත්තේ තේ සබ්බදස්සිනා
මුනිනා සම්මදක්ඛාතා, භාවිතා බහුලීකතා

6 සංවත්තන්ති අභිඤ්ඤාය, නිබ්බානාය ච බෝධියා
එතේන සච්චවජ්ජේන, සොත්ථි තේ හෝතු සබ්බදා

7 ඒකස්මිං සමයේ නාථෝ, මොග්ගල්ලානඤ්ච කස්සපං
ගිලානේ දුක්ඛිතේ දිස්වා, බොජ්ඣංගෙ සත්ත දේසයී

8 තේ ච තං අභිනන්දිත්වා, රෝගා මුච්චිංසු තං ඛණේ
එතේන සච්චවජ්ජේන, සොත්ථි තේ හෝතු සබ්බදා

9 ඒකදා ධම්මරාජාපි, ගෙලඤ්ඤේනාභිපීළිතෝ
චුන්දත්ථේරේන තං යේව, භණාපෙත්වාන සාදරං

10 සම්මෝදිත්වා ච ආබාධා, තම්හා වුට්ඨාසි ඨානසෝ
එතේන සච්චවජ්ජේන, සොත්ථි තේ හෝතු සබ්බදා

11 පහීනා තේ ච ආබාධා, තිණ්ණන්නම්පි මහේසානං
මග්ගාහතකිලේසාව පත්තානුප්පත්තිධම්මතං
එතේන සච්චවජ්ජේන සොත්ථි තේ හෝතු සබ්බදා

## සිංහල තේරුම්



1 බොජ්ඣංග දහමින් සියළු දුක් ද සසර
දික් කරමින් සිටින මරසෙන් ද නැසේ.

2 උතුමෝ මේ දහම දැනගෙන තිලොව
ජයගෙන රෝදුක් බිය නොදෙන
නිවන් සුවයෙන් සද සැනසුනාහ,

3 මෙබඳු ගුණයෙන් යුත් නොයෙක් ගුණ
එක්රුස් වුණ බෙහෙතකට සම වන
බොජ්ඣංග වන මෙය කියමු.

4 සිහිය, දම් විමසුම, වීරිය, සිත සැනසුම,
මැදහත් කම, සමාධි ද බොජ්ඣංග වන
මෙයයි.

5 සත් වැදැරුම් වන මේ දහම සම්බුදු හිමි
විසින් මැනවින් දැන සැමවිට වඩන
ලද්දේය

6 උසස් ඥණය දෙන නිවන සම්බුදු බව
දෙන මේ සැබෑ වදනින් ඔබට සැමදින
සුවසෙත වේවා!

7 එකල්හි කස්සප හා මොග්ගල්ලාන හිමි
වරු ගිලන් වී සිටිනු නෙතින් දුටු
බුදුහිමි බොජ්ඣංග පිරිත දෙසූ සේක,

8 එම දහම ඇසිමෙන් සැණෙකින් රෝග
දුරු විය. මේ සැබෑ වදනින් ඔබට සැමදින
සුවසෙත වේවා !

9 දිනක් බුදුහිමි ගිලන් බවෙන් පෙළී සිටි
විට චුන්ද තෙරණුන් ලවා මේ පිරිත
කියවීය.

10 ඉන් සතුටු වීමෙන් මුනිඳුන් සුවපත්
විය. මේ සැබෑ වදනින් ඔබට සැමදින
සුවසෙත වේවා!

11 මේ උතුම් පිරිතෙන් සියළු ආබාධ
සැණෙකින් දුරු වේ. මේ සැබෑ වදනින්
ඔබට සැමදින සුවසෙත වේවා!

## ගිනි පිරිත

ජාලෝ මහා ජාලෝ
ජාලං මහා ජාලං
ජාලිතේ මහා ජාලිතේ
ජාලිතං මහාජාලිතං
මුඛේ මුඛේ සම්පත්තේ
මුඛං මුඛං සම්පත්තං සුතං ගමිති,
මිගයිති, මිගයිති, දිට්ඨාලා, දන්තලා මණ්ඩලා,
රොකිලා කරලා
දුබ්බලා
රිත්ති, රිත්ති
ලිත්ති, ලිත්ති
කිත්ති, කිත්ති
මිත්ති, මිත්ති
විත්ති, විත්ති
මුත්ති, මුත්ති
වුත්ති, වුත්ති
ධාරණී,ධාරණීති.

භවතු සබ්බ මංගලං - රක්ඛන්තු සබ්බ දේවතා
සබ්බ බුද්ධානුභාවේන - සදා සොත්ථී භවන්තු මේ
පකද්ව මාර ජිතෝ නාථෝ - පත්තෝ සම්බෝධි මුත්තමං
චතුසච්චං පකාසේසි - මහාවීරං නමාමහං
එතේන සච්චවජ්ජේන - සබ්බේ මාරා පලායන්තු

භවතු සබ්බ මංගලං - රක්ඛන්තු සබ්බ දේවතා
සබ්බ ධම්මානුභාවේන - සදා සොත්ථී භවන්තු මේ
පකද්ව මාර ජිතෝ නාථෝ - පත්තෝ සම්බෝධි මුත්තමං
චතුසච්චං පකාසේසි - මහාවීරං නමාමහං
එතේන සච්චවජ්ජේන - සබ්බේ මාරා පලායන්තු

භවතු සබ්බ මංගලං - රක්ඛන්තු සබ්බ දේවතා
සබ්බ සංඝානුභාවේන - සදා සොත්ථී භවන්තු මේ
පකද්ව මාර ජිතෝ නාථෝ - පත්තෝ සම්බෝධි මුත්තමං
චතුසච්චං පකාසේසි - මහාවීරං නමාමහං
එතේන සච්චවජ්ජේන - සබ්බේ මාරා පලායන්තු

## වැසි පිරිත

සුභූතෝ ච මහාථේරෝ - මහාකායෝ මහෝදරෝ
නීලවණ්ණෝ මහාතේජෝ - පවස්සන්තු වලාහකා

අභිත්ථනය පජ්ජුන්න - නිධිං කාකස්ස නාසය
කාකං සෝකාය රන්ධෙහි - මං ච සොකා පමෝචය
ඒතේන සච්චවජ්ජේන - සම්මා දේවෝ පවස්සතු

## සිංහල තේරුම්

මැනවින් පවතින්නාවූ මහත් කයක් ඇති මහත් උදරයක් ඇති වැහි වලාකුළු වසිත්වා!

වැහි දෙවිය ගෙරවන්න. මාළුන් කපුටන්ගෙන් මුදවාලන්න. මාද ශෝකයෙන් මුදවාලන්න. මේ සත්‍ය වචනයෙන් යහපත් වැස්ස වසීවා!.

1 පුරෙන්තං බෝධිසම්භාරේ
නිබ්බත්තං වට්ටකජාතියං
යස්ස තේජේන දවග්ගි
මහාසත්තං විවජ්ජයී

2 ථෙරස්ස සාරිපුත්තස්ස
ලෝකනාථෙන භාසිතං
කප්පට්ඨායිං මහාතේජං
පරිත්තං තං භණාමහේ.

3 අත්ථි ලෝකේ සීලගුණෝ
සච්චං සෝචෙය්‍යානුද්දයා
තේන සච්චේන කාහාමි
සච්චකිරියමනුත්තරං.

4 ආවජ්ජිත්වා ධම්මබලං
සරිත්වා පුබ්බකේ ජිනේ
සච්චබලමපස්සාය
සච්චකිරියං අකාසහං.

5 සන්ති පක්ඛා අපතනා
සන්ති පාද අවඤ්චනා
මාතාපිතා ච නික්ඛන්තා
ජාතවේද පටික්කම
සහසච්චකතෝ මය්හං
මහාපජ්ජලිතෝ සිඛී,
වජ්ජේසි සෝළස කරීසානි
උදකං පත්වා යථා සිඛී

6 සච්චේන මේ සමෝ නත්ථි
ඒසා මේ සච්චපාරමී
එතේන සච්චවජ්ජේන
සොත්ථි තේ හෝතු සබ්බදා



1 බුදු බව පතා උන් බුදුන් වහන්සේ එක් භවයක
වටු ජාතියෙ ඉපිද තදින් පැතිරෙන ලැව්ගින්නක්
වැළැක්විය

2 බුදුන් වහන්සේ සැරියුත් හිමිට දෙසූ කපක් බල
මේ පිරිත ඔබහට සෙත සුව පතා දෙසමු.

3 ලොව ඇති සැබෑ පිරිසිදු දයා සිල් ගුණ
බලය මත උතුම් අදිටන් කරමි

4 දම්ගුණ ද පෙර බුදුවරුන්ගේ සැබෑ බස ගැන
මෙනෙහි කොට මෙලෙසින් අදිටන් කළෙමි.

5 පියාපත් ඇතිමුත් පියැඹීමට අසමත්, පා දෙකක්
ඇතිමුත් යා නොහැකි, මව්පියන් මා වනමැද
අතහැර ගොස් ඇතිවිට රුදුරු ගිණිකඳ ආපසු
යන ලෙස

6 ඉතා තදින් පැතිරුණු ගිණිකඳ මේ අදිටන
සමගින් ඒ දෙසට නොපැමිණ නැවතුණේ ය,
මේ සැබෑ වදනින් ඔබට සුවසෙත වේවා !

පරිත්තං යං භණන්තස්ස - නිසින්නට්ඨාන ධෝවනං
උදකම්පි විනාසේති - සබ්බමේව පරිස්සයං

මේ අංගුලිමාල පිරිත දේශනා කිරීමට දේශකයා ඉඳගත් ආසනය සේදූ ජලය පවා සියලු උවදුරු විනාශ කරයි.

සොත්ථිනා ගබ්භවුට්ඨානං - යං ච සාධෙති තං ඛණේ
ථේරස්සංගුලිමාලස්ස -ලෝකනාථේන භාසිතං
කප්පට්ඨායි මහාතේජං - පරිත්තං තං භණාමහේ

අංගුලිමාල තෙරුනට බුදුහිමි දෙසූ උතුම් පිරිත දෙසමු ඔබහට සුවපතා.

යතෝහං භගිනි අරියාය - ජාතියා ජාතෝ
නාභිජානාමි සඤ්චිච්ච පාණං - ජීවිත වොරොපේතා
තේන සච්චේන සොත්ථි තේ - හෝතු සොත්ථි ගබ්භස්සාති

නැගණියනි, සසුනෙහි දෙවන වර උපත ලද අංගුලිමාල වන මා පැවිදි දිවියෙහි කිසිදු සතෙකුගේ පණ නැසුයේ නැත. එම සැබෑ වදනින් ඔබ ගැබට සෙතක් වේවා!.

## ජිනපඤ්ජරය

1 ජයාසනගතා වීරා - ජෙත්වා මාරං සවාහණිං
චතුසච්චාමතරසං - යෙ පිවිංසු නරාසභා

2 තණ්හංකරාදයෝ බුද්ධා - අට්ඨවීසති නායකා
සබ්බෙ පතිට්ඨිතා තුය්හං - මත්ථකෙ තේ මුනිස්සරා

3 සිරෙ පතිට්ඨිතා බුද්ධා - ධම්මෝච තව ලෝචනේ
සංඝෝ පතිට්ඨිතෝ තුය්හං - උරේ සබ්බගුණාකරෝ

4 හදයෙ අනුරුද්ධෝ ච - සාරිපුත්තෝ ච දක්ඛිණේ
කොණ්ඩඤ්ඤෝ පිට්ඨිභාගස්මිං - මොග්ගල්ලානෝසි වාමකෙ

5 දක්ඛිණේ සවණේ තුය්හං - ආහුං ආනන්ද රාහුලා
කස්සපෝ ච මහානාමෝ - උභෝසුං වාමසෝතකේ

6 කේසන්තේ පිට්ඨිභාගස්මිං - සූරියෝ විය පභංකරෝ
නිසින්නෝ සිරිසම්පන්නෝ - සෝභිතෝ මුනිපුංගවෝ

7 කුමාරකස්සපෝ නාම - මහේසි චිත්‍රවාදකෝ
සෝ තුය්හං වදනේ නිච්චං - පතිට්ඨාසි ගුණාකරෝ

8 පුණ්ණෝ අංගුලිමාලෝ ච - උපාලී නන්ද සීවලි
ථෙරා පඤ්ච ඉමේ ජාතා - ලලාටේ තිලකා තව

9 සේසාසීති මහාථෙරා - විජිතා ජිනසාවකා
ජලන්තා සීලතේජේන - අංගමංගේසු සණ්ඨිතා

10 රතනං පුරතෝ ආසි - දක්ඛිණේ මෙත්තසුත්තකං
ධජග්ගං පච්ඡතෝ ආසි - වාමේ අංගුලිමාලකං

11 ඛන්ධමෝරපරිත්තං ච - ආටානාටියසුත්තකං
ආකාසච්ඡදනං ආසි - සේසා පාකාරසඤ්ඤිතා

12 ජිනා'ණාබල සංයුත්තේ - ධම්මපාකාර'ලංකතේ
වසතෝ තේ චතුකිච්චේන - සදා සම්බුද්ධපඤ්ජරේ

13 වාතපිත්තාදිසඤ්ජාතා - බාහිරජ්ඣත්තු'පද්දවා
අසේසා විලයං යන්තු - අනන්තගුණ තේජසා

14 ජිනපඤ්ජර මජ්ඣට්ඨං - විහරන්තං මහීතලේ
සදා පාලෙන්තු ත්වං සබ්බේ - තේ මහාපුරිසා'සභා

15 ඉච්චේව මච්චන්තකතෝ සුරක්ඛෝ
ජිනානුභාවේන ජිතුපපද්දවෝ
බුද්ධානුභාවේන හතාරිසංඝෝ
චරාහි සද්ධම්මනුභාවපාලිතෝ

## සිංහල තේරුම්

1 බුදුවරයානන් වහන්සේලා චතුරාර්‍ය සත්‍යය අවබෝධකොට මාරසේනා පරාජය කොට ශාන්ත තැනකට පිවිසීහ.

2 තණ්හංකර ආදි බුදුවරු විසි අට දෙනා වහන්සේලා ඔබේ හිස් මුදුනෙහි පිහිටියහ.

3 බුදුවරයන් වහන්සේලා ඔබගේ හිසෙහිත් ශ්‍රී සද්ධර්මය ඔබේ ඇසෙහිත් සියලු ගුණවලින් පිරි සංඝරත්නය උරහිස්වලත් පිහිටියහ.

4 අනුරුද්ධ රහතුන් ඔබේ හදවතෙහිද,සැරියුත් රහතුන් දකුණු උරෙහිත්, කොණ්ඩඤ්ඤ රහතුන් පිටෙහිද, මුගලන් රහතුන් වම් උරහිසෙත් වැඩසිටින සේක.

5 ආනන්ද සහ රාහුල රහතුන් දකුණු කණේත් කාශ්‍යප හා මහානාම රහතුන් වම් කණේත් වැඩසිටින සේක.

6 පිටුපස කෙස් අග ප්‍රභාශ්වර සූර්යයා මෙන් හිඳ ශ්‍රියාවෙන් පිරුණු සෝභිත මුනි වැඩසිටින සේක.

7 ගුණයට ආකරයක් වූ කුමාරකස්සප නම්වූ කථිකයාණෝ ඔබේ වචනයෙහි රැඳී සිටින සේක.

8 පුණ්ණ, අංගුලිමාල, උපාලි, නන්ද, සීවලී යන තෙරුන් ඔබගේ නළලෙහි තිලකයක් සේ වැඩසිටින සේක.

9 බුදු සසුනේ සිල් තේජසින් යුත් අසූවක් මහ තෙරුන් ඔබගේ අංගප්‍රත්‍යංගයන්හි පිහිටි සේක.

10 රතන සූත්‍රය ඔබගේ ඉදිරියෙන් ද, දකුණින් කරණීය මෙත්ත සූත්‍රය ද, ධජග්ග සූත්‍රය පිටුපසින් ද,අංගුලිමාල සූත්‍රය වම්පසින් ද වේ.

11 ඛන්ධ පිරිතද, මෝර පිරිතද, ආටානාටිය සූත්‍රය ද අහසෙහි වියනක් සේ ද සෙසු සූත්‍ර ප්‍රාකාරයක් මෙන් ද වේ.

12 ජිනවරුන්ගේ බල මහිමෙන් ද, ධර්ම ප්‍රාකාරයෙන්ද, බුදුන්වහන්සේලා විසින් වටකර ගත් දැලෙහි වසන ඔබට ශාන්තියක්ම වේවා!.

13 බුදුන්වහන්සේගේ අනන්ත ගුණ තේජසින් වා පිත්වලින් ආදි රෝග, බාහිර හා අභ්‍යන්තර උපද්‍රව හා සියලු කරදර හංග වේවා!

14 ජින(බුදු) පංජරය(කූඩුව) මැද වසන ඔබව ඒ උතුම් මහා පුරුෂයෝ පොළෝ තලයේ සැම ද රකිත්වා!

15 පතන දෙය දෙමින් රැකවරණය කරමින් බුදුන්වහන්සේගේ ආනුභාවයෙන් මැඩ පවත්වන ලද උපද්‍රව ඇති බුද්ධානුභාවයෙන් සුරැකිව සිටිවා!

16 ඉච්චේව මච්චන්තකතෝ සුරක්ඛෝ
ජිනානුභාවේන ජිතුපපද්දවෝ
ධම්මානුභාවේන හතාරිසංඝෝ
වරාහි සද්ධම්මනුභාවපාලිතෝ

16 පතන දෙය දෙමින් රැකවරණය කරමින්
බුදුන්වහන්සේගේ ආනුභාවයෙන් මැඩ
පවත්වන ලද උපද්‍රව ඇති ධම්මානුභාවයෙන්
සුරැකිව සිටීවා!

17 ඉච්චේව මච්චන්තකතෝ සුරක්ඛෝ
ජිනානුභාවේන ජිතුපපද්දවෝ
සංඝානුභාවේන හතාරිසංඝෝ
වරාහි සද්ධම්මනුභාවපාලිතෝ

17 පතන දෙය දෙමින් රැකවරණය කරමින්
බුදුන්වහන්සේගේ ආනුභාවයෙන් මැඩ
පවත්වන ලද උපද්‍රව ඇති සංඝානුභාවයෙන්
සුරැකිව සිටීවා!

18 සද්ධම්මපාකාරපරික්ඛිතෝසි
අට්ඨා'රියා අට්ඨදිසාසු හොන්ති
එත්ථන්තරේ අට්ඨනාථා භවන්ති
උද්ධං විතානං ච ජිනා ඨිතා තේ

18 සද්ධර්මය නමැති ප්‍රාකාරයෙන් ආරක්ෂා
කල දිසා අටේම අරි අටැහි මගින් රැකවරණ
අටක් වේ. උඩින් වියනක් බැන්ද සේ ඔබට
උඩින් මුනිවරු සිටිති.

19 හින්දන්තෝ මාරසේනං තව සිරසි ඨිතෝ
බෝධිමාරුය්හ සත්ථා
මොග්ගල්ලානෝසි වාමේ වසති හුජතටේ
දක්ඛිණේ සාරිපුත්තෝ
ධම්මෝමජ්ඣේ උරස්මිං විරහති භවතෝ
මොකඛතෝ මෝරයෝනිං
සම්පත්තෝ බෝධිසත්තෝ චරණයුගගතෝ
හානුලෝකේකනාථෝ

19 මාර සෙනග ජය ගනිමින් බෝ සමිඳු අබියස
නැඟීසිටි මුනිඳුන් ඔබ සිරසෙහි වැඩසිටින
සේක. මුගලන් තෙරුන් වම් බාහුවෙහි ද ,
සැරියුත් තෙරුන් දකුණු බාහුවෙහි ද වැඩ
සිටිති. ධර්මය පපුව මැද පවතී.

20 සබ්බාවමඞගලමුපද්දවදුන්නිමිත්තං
සබ්බීති රෝග ගහදෝසමසේසනින්ද
සබ්බන්තරාය භය දුස්සුපිනං අකන්තං
බුද්ධානුභාවපවරේන පයාතු නාසං

20 සියලුම අවමංගල්‍යයන්, උපද්‍රවයන්, දුර්නිමිති
රෝග,ග්‍රහ දෝස, නින්ද අපහාස සියලුම
අන්තරායයන් සහ බියජනක දුක් සිහින
දැකීමාදිය බුද්ධානුභාවයෙන් හංගවී යෙත්වා!

21 සබ්බාවමඞගලමුපද්දවදුන්නිමිත්තං
සබ්බීති රෝග ගහදෝසමසේසනින්ද
සබ්බන්තරාය භය දුස්සුපිනං අකන්තං
ධම්මානුභාවපවරේන පයාතු නාසං

21 සියලුම අවමංගල්‍යයන්, උපද්‍රවයන්, දුර්නිමිති
රෝග,ග්‍රහ දෝස, නින්ද අපහාස සියලුම
අන්තරායයන් සහ බියජනක දුක් සිහින
දැකීමාදිය ධම්මානුභාවයෙන් හංගවී යෙත්වා!

22 සබ්බාවමඞගලමුපද්දවදුන්නිමිත්තං
සබ්බීති රෝග ගහදෝසමසේසනින්ද
සබ්බන්තරාය භය දුස්සුපිනං අකන්තං
සංඝානුභාවපවරේන පයාතු නාසං

22 සියලුම අවමංගල්‍යයන්, උපද්‍රවයන්, දුර්නිමිති
රෝග,ග්‍රහ දෝස, නින්ද අපහාස සියලුම
අන්තරායයන් සහ බියජනක දුක් සිහින
දැකීමාදිය සංඝානුභාවයෙන් හංගවී යෙත්වා!

## ඇනවුම් පිරිත

1 යෙ සන්තා සන්ත චිත්තා තිසරණසරණා එත්ථ
ලොකන්තරේ වා - භුම්මා භුම්මා ච දෙවා
ගුණගණගහණබ්‍යාවටා සබ්බකාලං,
ඒතෙ ආයන්තු දේවා වරකනකමයේ මේරුරාජේ වසන්තෝ
සන්තෝ සන්තෝසහේතුං මුනිවරවචනං
සොතුමග්ගං සමග්ගා.

2 සබ්බේසු චක්කවාළේසු, යක්ඛා දේවා ච බ්‍රහ්මුනෝ
සං අම්හේහි කතං පුඤ්ඤං, සබ්බසම්පත්තිසාධකං,
සබ්බේ තං අනුමෝදිත්වා, සමග්ගා සාසනේ රතා,
පමාදරහිතා හොන්තු, ආරක්ඛාසු විසේසතෝ

3 සාසනස්ස ච ලෝකස්ස, වුද්ධී භවතු සබ්බදා
සාසනම්පි ච ලෝකඤ්ච, දේවා රක්ඛන්තු සබ්බදා,
සද්ධිං හොන්තු සුඛී සබ්බේ, පරිවාරේහි අත්තනෝ,
අනීඝා සුමනා හොන්තු සහ සබ්බේහි ඤාතිභී

4 රාජතෝ වා චෝරතෝ වා මනුස්සතෝ වා
අමනුස්සතෝ වා
අග්ගිතෝ වා උදකතෝ වා පිසාචතෝ වා
ඛාණුකතෝ වා
කණ්ටකතෝ වා නක්ඛත්තතෝ වා
ජනපදරෝගතෝ වා
අසද්ධම්මතෝ වා අසන්දිට්ඨිතෝ වා
අසප්පුරිසතෝ වා
චණ්ඩහත්ථි - අස්ස මිග ගෝණ කුක්කුර අහිවිච්ඡික
මණිසප්පදීපිඅච්ඡතරච්ඡ සූකර -
මහිස යක්ඛරක්ඛසාදීහි
නානාභයතෝ වා නානාරෝගතෝ වා
නානාඋපද්දවතෝවා
ආරක්ඛං ගණ්හන්තු.-

5 පනිධානතෝ පට්ඨාය තථාගතස්ස දසපාරමියෝ
දසඋපපාරමියෝ දස පරමත්ථපාරමියෝ
පඤ්චමහාපරිච්චාගෝ තිස්සෝ චරියා පච්ඡිම භවේ
ගබ්භාවක්කන්තිං ජාතිං අභිනික්ඛමණං පධානචරියං
බෝධිපල්ලංකං මාරවිජයං සබ්බඤ්ඤුතඤ්ඤාණපටිවේධං
නවලෝකුත්තරධම්මේති සබ්බේපිමේ බුද්ධගුණේ
ආවජ්ජිත්වා
වේසාලියං තීසු පාකාරන්තරේසු තියාමරත්තිං පරිත්තං
කරොන්තෝ ආයස්මා ආනන්දථේරෝ විය කාරුඤ්ඤචිත්තං
උපට්ඨපෙත්වා.

සිංහල තේරුම්



1 යම් සත්ව සමූහයක් ශාන්ත වූවාහු, තිසරණ
සරණ ගියාවූහ, මේ ලෝක අන්තරයෙහි හෝ
භූමියෙහි වූ භුමාවූ දෙවියෝ සියලු කල්හි ගුණ
යෙන් යුක්තවෙත්වා. උතුම් රුවන්මය මහමෙර
පවුවෙහි වසන්නාවූ ඒ දෙවියෝ පැමිණෙත්වා,
ශාන්ත වූවාහු, සන්තෝෂයට හේතුවූ බුදුරජාණන්
වහන්සේගේ උතුම් වචනය සමගි වූවාහු අසත්වා.

2 සියලු සක්වළ වසන යක්ෂයෝද, දෙවියෝද,
බ්‍රහ්මයෝද සියලු සම්පත් සදන්නාවූ පිනක් අප
විසින් කරන ලද්දාහුද, සියලු දෙන ඒ පින්
අනුමෝදන්වී සමගි වූවාහු, ශාසනයෙහි ඇලුනාහු
වෙසෙසින් ආරක්ෂාවන්හි අප්‍රමාදී වෙත්වා.

3 සසුනෙහිද ලොවෙහිද සැම කල්හි දියුණුව
වේවා. සැමද දෙවියෝ සසුනද ලෝකයද රකිත්වා
සැමදෙන තම පිරිස් සමග සුවපත් වෙත්වා.
සියලු ඥාති සමූහයා සමගින් දුක් නැති වෙත්වා.
යහපත් සිත් ඇත්තාහු වෙත්වා.

4 රජ පිරිසගෙන්ද සොර සමූහයාගෙන්ද
මිනිසුන්ගෙන්ද අමනුෂ්‍යයන්ගෙන්ද ගින්නෙන් ද,
ජලයෙන් ද, පාංශු පිසාචයන්ගෙන් ද, උල්වලින්
ද, කටුවලින් ද, නැකැත් තරු වලින් ද ජන පද
රෝග(බෝවන රෝග) වලින්ද චණ්ඩවූ ඇත්,
අස්,මුව, ගෝණ සුනක, සර්ප, ගෝණුසු, මණි
සර්ප, දිවි, වලස්, කළු හිස් සහිත වලස්, ඌරු,
මීගොන්, යක්ෂ රාක්ෂාදීන්ගෙන්ද වන්නාවූ
නොයෙක් භය, රෝග, උපද්‍රව වලින් ආරක්ෂාව
ලබත්වා.

5 ප්‍රණීධානයේ පටන් තථාගතයන් වහන්සේගේ
දස පාරමිතා, දස උප පාරමිතා, දස පරමත්ත
පාරමිතා, පංච මහා පාරමිතා, ත්‍රිවිධ චර්යයා,
අන්තිම භවේ පිළිසිඳ ගැනීම, උපත, අබිනික්මය,
පධන් වීර්යය, බෝධිපරියංකය, මාර පරාජය,
සර්ව ඥතා ඥාන ප්‍රතිමේධය, නවලොව්තුරු
ධර්ම ද සියලුම බුදුගුණ මෙනෙහි කොට විසාලා
වේ ත්‍රිවිධ ප්‍රාකාර මාධ්‍යයෙහි තුන්යම් රුය
පිරිත් කරන්නාහු ආනන්ද තෙරුන් මෙන්
කරුණා සිත් උපද්දවා...

මම වෛර නැත්තෙක් වෙම්වා !
මම තරහ නැත්තෙක් වෙම්වා !
මම උවදුරු නැත්තෙක් වෙම්වා !
මම සුවපත් වෙම්වා !
මම නිදුක් වෙම්වා !
මම සැපසේ වසන්නෙක් වෙම්වා !
මම දුකින් මිදෙම්වා !

මා මෙන් ම මාගේ ගුරුවර උපධ්‍යායයෝ ද
මා මෙන් ම මාගේ දෙමාපිය සහෝදර සහෝදරියෝ ද
මා මෙන් ම මාගේ හිතවත් සත්ත්වයෝ ද
මා මෙන් ම මාගේ මැදහත් සත්ත්වයෝ ද
මා මෙන් ම මාගේ වෛරි සත්ත්වයෝ ද
අවෛරී වෙත්වා !
තරහ නැත්තෝ වෙත්වා !
උවදුරු නැත්තෝ වෙත්වා !
සුවපත් වෙත්වා !
නිදුක් වෙත්වා !
සැපසේ ජීවත්වන්නෝ වෙත්වා !
දුකින් මිදෙත්වා !

## නරසීහ ගාථා

1 චක්කවරංකිත රත්තසුපාදෙ
ලක්ඛණ මණ්ඩිත ආයත පණ්හී
ජාමර ජත්ත විභූසිත පාදෙ
එ සහි තුය්හ පිතා නරසීහො

2 සක්‍ය කුමාර වරො සුකුමාලො
ලක්ඛණ විත්තිත පුණ්ණ සරීරො
ලොක හිතාය ගතො නරවීරො
එ සහි තුය්හ පිතා නරසීහො

3 පුණ්ණ සසංක නිභො මුඛවණ්ණො
දෙවනරාන පි යො නරනාගො
මත්ත ගජින්ද විලාසිත ගාමී
එ සහි තුය්හ පිතා නරසීහො

4 ඛත්තිය සම්භව අග්ග කුලීනො
දෙව මනුස්ස නමස්සිත පාදෙ
සීල සමාධි පතිට්ඨිත චිත්තො
එ සහි තුය්හ පිතා නරසීහො

5 ආයත තුංග සුසණ්ඨිත නාසො
ගොපඛුමො අභිනීල සුනෙත්තො
ඉන්දධනු අභිනීල භමුකො
එ සහි තුය්හ පිතා නරසීහො

6 වට්ට සුමට්ට සුසණ්ඨිත ගීවො
සීහ හනු මිගරාජ සරීරො
කඤ්චන සුච්ඡවි උත්තම වණ්ණො
එ සහි තුය්හ පිතා නරසීහො

7 සිනිද්ධ සුගම්භිර මඤ්ජු සුඝොසො
හිංගුල බන්ධු සුරත්ත සුජිව්හො
වීසති වීසති සෙත සුදන්තො
එ සහි තුය්හ පිතා නරසීහො

8 අඤ්ජන වණ්ණ සුනීල සුකෙසො
කඤ්චන පට්ට විසුද්ධ ලලාටො
ඔසධි පණ්ඩර සුද්ධ සු උණ්ණො
එ සහි තුය්හ පිතා නරසීහො

9 ගච්ඡති නීල පථෙ විය චන්දෙ
තාරගණා පරිවෙඨිත රූපො
සාවක මජ්ඣගතො සමණින්දෙ
එ සහි තුය්හ පිතා නරසීහො

## සිංහල තේරුම්



1. උතුම් සක් ලකුණෙන් ලකුණු කරණ ලද රතු පාටින් හොබනාවූ මනා පා යුවලක් ඇති ස්වස්තිකය, ශ්‍රීවත්සය යනාදි මඟුල් ලකුණෙන් සැරසුනු දික්වූ විළුම් ඇති චාමරජත්‍ර ලක්ෂණයෙන් සැදුම් ලත් සිරි පා තල ඇති අර (එන) ශ්‍රේෂ්ඨ තෙම නුඹේ පියාය.

2. ශාක්‍ය කුමාරොත්තම වූ (එහෙයින්ම) සියුමැලි වූ මහා පුරුෂ ලක්ෂණයෙන් විසිතුරු වූ පිරිපුන් සිරුරක් ඇති තුන්ලෝ වැස්සන්ට හිත වැඩ පිණිස වැඩියා වූ වීර මනුෂ්‍ය වූ අර (එන) ශ්‍රේෂ්ඨ තෙම නුඹේ පියාය.

3. පුන්සඳ සේ බබලන මුව සෝබා ඇති දෙව් මිනිසුන් මන වඩන්නා වූ නරොත්තම වූ මත් වූ ඇත් රජෙකුගේ ගමන් වැනි ගමන් ඇත්තාවූ යම් උතුමෙක් (වේ ද) අර (එන්නේ) නරශ්‍රේෂ්ඨ වූ (ඒ) නුඹේ පියාය.

4. කැත් කුලයෙහි ඉපදීම හේතුවෙන් ශ්‍රේෂ්ඨ කුල ඇත්තාවූ දෙව් මිනිසුන් විසින් වඳින ලද පා ඇති ශීල සමාධි දෙක්හි පිහිටියා වූ සිත් ඇති අර නරශ්‍රේෂ්ඨ තෙම වනාහි නුඹගේ පියාය.

5. දික්වූ උස්වූ හොඳ හැටි පිහිටි නැහැයක් ඇති ගවෙයෙකුගේ ඇස් පිහාටු වැනි වූ ඉතා නිල් වූ සුන්දර නෙත් ඇති දෙව්දුනු දෙකක් වැනි වූ ඉතා නිල් වූ බැම දෙකක් ඇති අර නරශ්‍රේෂ්ඨ තෙම වනාහි නුඹේ පියාය.

6. වට වූ හොඳින් පිහිටි ග්‍රීවා ඇති සිංහයෙකුගේ හනු වැනි හනු ඇති සිංහරාජයෙකුගේ පෙරඬ කය වැනි පිරිපුන් සිරුරක් ඇත්තාවූ කසුන් වන් මනා සිවි ඇති උතුම් පැහැ ඇති අර නරශ්‍රේෂ්ඨ තෙම නුඹේ පියාය.

7. සිනිඳු වූ ඉතා ගැඹුරු වූ මිහිරි වූ මනා හඬ ඇති රත්සිරියල් වැනි වූ ඉතා රතු වූ මනා දිවක් ඇති උඩ යට හනු දෙක්හි විස්ස බැගින් සුදු දත් ඇති අර නරශ්‍රේෂ්ඨ තෙම නුඹේ පියාය.

8. අඳුන් පාට ඇති ඉතා නිල් වූ මනා කෙහෙ ඇති රන් පටක් වැනි පිරිසිදු නලලක් ඇති ඕසධි තරුව මෙන් සුදු වූ පිරිසිදු වූ මනා ඌර්ණ රෝම ඇති අර නරශ්‍රේෂ්ඨ තෙම නුඹේ පියාය.

9. තරු සමූහයා පිරිවැරූ චන්ද්‍ර තෙම අහසෙහි (යන්නාක්) මෙන් සව්වන් මැදට පැමිණි ශ්‍රමණෙන්ද්‍ර වූ නරසීහ වූ අර නුඹේ පියාය.

## නව ග්‍රහ ශාන්තිය

අරහං බුදුගුණෙන් මගේ ඉරුගෙ අපල දුරුවේවා
ලෙඩ දුක් බිය නොවී කිසිත් සතුට සැපත වැඩිවේවා

සම්මා සම්බුද්ධ තෙදින් සඳුගෙ අපල දුරුවේවා
මාරක බාධක වැලකී මගේ පැතුම් ඉටුවේවා

විජ්ජාචරණෝ බලයෙන් අඟහරු දොස් දුරුවේවා
වස විස ගිණි සතුරු විපත් මා වෙත ලං නොමවේවා

සුගතෝ බුදුගුණෙන් මගේ බුදගෙ අපල දුරුවේවා
ගුණ නුවණින් වැඩී සියලු සැප සම්පත් ඉතිරේවා

ලෝකවිදූ තෙදින් මගේ ගුරුගෙ දෝස දුරුවේවා
සතුට සමාදානය මට නිරෝගී සුව වැඩිවේවා

අනුත්තරෝ බුදුගුණයෙන් සිකුරු අපල දුරුවේවා
සිතුමිණ වගෙ රුවන් ගැබක ආයුෂ මගෙ වැඩීවේවා

පුරිස ධම්ම සාරථී බලමහිමෙන් සැඩ සෙනසුරාගෙ
අපල විකල භූත දෝස ගැටුම් වැටුම් හා කොඩිවින
දුරුර සියලු මෙකී දෝස විලස සාදු ජය බෝ රුක
ජින පංජරයක් වේවා සෙනසුරු දොස් දුරුවේවා

සත්ථා බුදු ගුණෙන් මගේ රාහු අපල දුරුවේවා
යක්ෂ ප්‍රේත විත බන්ධන අහෝසි වී නැතිවේවා

හගවා යන විදූරවියෙන් කේතු අපල නැතිවේවා
මගේ කයට බසට සිතට සැපත සතුට වැඩිවේවා

මකර කුම්භ මිථුන තෙරැස මාරක බිය දුරුවේවා
කැපී කෝටියක්ම දෝස මට ජය මග හෙළිවේවා

සිංහ මේෂ ධනු තුන්රැස බාධක බිය දුරුවේවා
තිසරණ සරණින් ජයසිරි සුබසෙත මට ළංවේවා

මීන කටක නුහුනු තෙරැස සැම ග්‍රහ දොස් දුරුවේවා
ජීව සිද්ධි බලෙන් මගේ බුදු සරණින් සුරැකේවා

වෘෂභ කන්‍යා තුලා තෙරැස සැම ග්‍රහ දොස් දුරුවේවා
දම් සරණින් මගේ අපල දුරුවී සිරි සෙත වේවා

රාහු කේතු රවි සඳු කුජ සිකුරු බුද ගුරු ශනි යන මේවා
ඇතිකරවන අපල මෙමට සග සරණින් දුරුවේවා

තෙරුවන් ගුණ සුවඳ අමා ඔසුවෙන් මට සැපවේවා
මගේ ගෙදර අයට මටද ජයසිරි සෙත ළංවේවා

නවග්‍රහ සහ භූත දෝස සැම දුරුවී සැපවේවා
ජය බෝරුක මුණි පිට දුන් මට ජය සේසත වේවා

## බෝධි පූජා කවි

1 දැත නළලෙ බැඳ වැඳුම් ලබන් නේ
සැම දෙනාහට පින් කෙත වන් නේ
නේක දහම් සිසිලෙන් බබලන් නේ
සාදු සාදු බුදු හිමි නමදින් නේ

2 දැත නළලෙ බැඳ වැඳුම් ලබන් නේ
සැම දෙනාහට පින් කෙත වන් නේ
නේක දහම් සිසිලෙන් බබලන් නේ
සාදු සාදු සදහම් නමදින් නේ

3 දැත නළලෙ බැඳ වැඳුම් ලබන් නේ
සැම දෙනාහට පින් කෙත වන් නේ
නේක දහම් සිසිලෙන් බබලන් නේ
සාදු සාදු මහ සග නමදින් නේ

4 රන්වන් පාටින් දලු ලන බෝධිය
නිල්වන් පාටින් කොළ ලන බෝධිය
ගෞතම මුනිඳුන් පිට දුන් බෝධිය
අපිත් වඳිමු ජය සිරිමා බෝධිය

5 දෙව් ලොව දෙවියන් පුද කළ බෝධිය
නා ලොව සතියක් පුද ලද බෝධිය
දෙනෝදහක් නිති වඳිනා බෝධිය
අපිත් වඳිමු ජය සිරිමා බෝධිය

6 දඹදිව් තලයේ හටගත් බෝධිය
සඟමිත් තෙරණින් ගෙන වැඩි බෝධිය
හිමි බුදු වනද පිට දුන් බෝධිය
අපිත් වඳිමු ජය සිරිමා බෝධිය

7 මම මේ මළුවට යනවා එන වා
බෝමුල් බෝ පත් මට පැගෙන වා
සමාව දී මගෙ පව් අරවන වා
බෝ රජුනේ මට අවසර දෙන වා

8 උඩ මළුවේ බෝ රජු වැජඹෙන වා
දෙවැනි මළුවේ මල් පහන් පිදෙන වා
වැලි මළුවේ මහ සෙනඟ වඳින වා
මතු මත්තේ අපි නිවන් දකින වා

9 සුදු බුදු රුස් දහරින් ලොව නහ වා
බුදු හාමුදුරුවො හොඳ බණ කී වා
පුදම් පහන් මම සිරිපද ගා වා
බිඳ බව දුක සැනසුම හිමි වේ වා

10 සැම උදයෙම බුදු රුස් විහිදේ වා
සැම සිතකම බුදු ගුණ නැහැ වේ වා
සැම දැයකම අය ඉන් සැනසේ වා
සැම රටකම බොදු හඬ පැතිරේ වා

ආකාසට්ඨා ච භුම්මට්ඨා - දේවානාගා මහිද්ධිකා
පුඤ්ඤංතං අනුමෝදිත්වා - විරං රක්ඛන්තු ලෝක සාසනං

**විෂ්ණු දෙවියන්ට**
නමාමි විෂ්ණු දේවං තං - සර්වාරක්ෂාවිධායකම්
අවිඝ්නං කුර්වතාං මහ්‍යං - සර්ව කාර්යේෂු සර්වද

**කතරගම දෙවියන්ට**
වන්දේ ස්කන්ධකුමාරං තං - කාවරග්‍රාමගෝවරං
පරිරක්ෂතු මාං නිත්‍යං - වර්ධයන් සුඛසම්පදං

**සුමන සමන් දෙවියන්ට**
සර්වඥස්‍ය මුනීන්ද්‍රස්ස්‍ය - පාදවිහ්නස්‍ය ගෝපකං
වන්දේ සුමනදේවං තං - ශිවං මේ යච්ජතාං වරම්

**පත්තිනි දේවියට**
මාතරං පත්තිනිං වන්දේ - සර්වසත්ව ශිවංකරං
දදතාං සතතං මහ්‍යං - ආරෝග්‍යං රක්ෂණං බලම්

**සරස්වතී දේවියට**
දේවීං සරස්වතීං වන්දේ - සර්ව ශාස්ත්‍රාධිනායකීං
ප්‍රවර්ධයතු මේ බුද්ධිං - මෝහකාලුෂ්‍යනාශනං

**ගණ දෙවියන්ට**
වන්දේ ගණේෂං දෙවේන්ද්‍රං - සර්ව විඝ්නාපහාරිණං
ආරක්ෂාං කුරුතාං මහ්‍යං - කාර්‍යාකාර්‍යෝෂු සර්වද

**ඊශ්වර දෙවියන්ට**
ත්‍රිනෙත්‍රමීශ්වරං වන්දේ - සතතං ලෝකශංකරං
විද්‍යධාතු ච මේ නිත්‍යං - ආයුර්වර්ණං සුඛං බලං

**භද්‍රකාලි දේවතාදූවට**
භද්‍රකාලිං නමේ නිත්‍යං - විඝ්නදෝෂහරං වරං
විදධාතු සද මහ්‍යං - ආයුරාරෝග්‍යසම්පදම්